

# සාසනශුභ දීපනීය

# සාසනසුබදීපනිය.

කුරුණෑගල පලාතේ

දෙකඳුවල සුමනසාර ස්වාමීන්

විසින්

සම්පාදනයකොට

ජූ. එච්. පින්හාමි ගම්ආරච්චිමහත්මයා

විසින්

අච්චුගසවා ප්‍රසිද්ධකරණලදී.

පෑලියගොඩ ශෙව්‍යශ්‍රී යන්ත්‍රශාලාවේදී

අච්චුගසනලදී.

1899.

# සාසනසුද්ධදීපනිය.

වන්දනං සරණාගමනං සීලරක්ඛණ දස්සනං
භාවනාදුස්සීලදානං සුපටිවජ්ජනා පභෙදනං
කප්පාකප්පපත්තානංච ඡත්තධාරණ මෙවච
අඞ්ගංච දළ්හීකම්මංච දසධාවුච්චන්ති මෙ.

යනාදී මේ ගාථාවෙන් දක්වනලද වන්දනානියමය, සරණාගමණය
සීලපාලන දර්ශනය, භාවනාකිරීමේ පිළිවෙල, දුස්සීලදානය, සුපිළි
සන්ව සිවුරුපෙරවීම, කැපඅකැප පාත්‍රාදැක්වීම, කුඩඉසලීමේ ක්‍රමය,
තෙලෙස්ධුතාඞ්ග සමාදානය, දළ්හීකර්මය, යන මේ දසවැදෑරුම් ධර්ම
යෝ මෙහි විස්තරකරණුලැබේ. තවද මේ සාසනසුද්ධදීපනියෙහි
පළමුකොට වන්දනාපරිච්ඡේදය මෙසේ දතයුතු; "වන්දන්තීති වන්දනං"
බුදුන්වැඳීමද, සධාතුකචෛත්‍යවන්දනාවද, බොධිවන්දනාවද, ධර්ම
වන්දනාවද, සඞ්ඝයා වැඳීමද, යනාදී වන්දනාවන් අතුරෙන් යම් වන්ද
නාවක් පවත්වනකල්හි ඒ නමස්කාර කටයුතු වස්තුවෙහි ගුණ
සිහිකර වැඳීමද; යම්පූජාවක් පූජාකරණකල්හි බුද්ධාදී රත්නත්‍රයෙහි
ගුණ මෙනෙහිකර පූජාකිරීමද; නිර්වාණය ප්‍රාර්ථනාකොට පූජාකිරීම
හා වැඳීම කටයුතුකෙනාය; "වන්දනස්ස අභිවාදනං එතං අධිවචනං."
යථොක්ත නමස්කාරයට අභිවාදනයයි කියාද නමෙකි, යනමේ ක්‍රියා
පදයට සමානාර්ථය වන්නේමය; "වන්දිතබ්බං වන්දති අභිවාදෙතබ්බං
අභිවාදෙති න මෙතබ්බං න මෙති" යනු වදාළබැවින් වැඳුයුතුතැනට
නමස්කාරකටයුත්තේය; "සම්මාදිට්ඨිකොසම්මාදිට්ඨියා සම්මාවාචාය
සම්මාවාචෙතබ්බා සම්මාචෙතසා සම්මාසද්ධාය අනීතිකංතිපුනං පරායනං
සරණං දුක්ඛක්ඛයං අනන්තං සුදුද්දසං අනාසවංධුවං අනිදස්සනං අක
තං අපලොකිතං අක්ඛරංසිවං අසංඛතං අමතමහානිබ්බාණං සච්ඡික
රණත්ථායජාතිදුක්ඛං ජරාදුක්ඛං ව්‍යාධිදුක්ඛං මරණදුක්ඛං සොකදු
ක්ඛං පරිදෙවදුක්ඛං දොමනස්සදුක්ඛං උපායාසදුක්ඛං අප්පියෙහි සම්ප
යොගදුක්ඛං පියෙහි විප්පයොග දුක්ඛං ඉච්ඡාවිඝාතදුක්ඛං එතං සබ්බ
දුක්ඛං පහීනං බුද්ධංච ධම්මංච සංඝංච වන්දන්ති වන්දනං" යනුහෙ
යින් රත්නත්‍රය විෂයෙහි පැහැදුනාවූ සිතින් සම්‍යක්දෘෂ්ටිය හෙතු
කොටගෙණ සම්‍යක්දෘෂ්ටි පුද්ගලතෙමේ රත්නත්‍රයෙහි ගුණ කියා
මිනාකොට අමෘතමහා නිර්වාණය ප්‍රත්‍යක්ෂකිරීම පිණිස පසඟපිහිටුවා

වඳින්නේයයි දතයුත්තේය; තවද පින්වත්නි ඒ නමස්කාරය රත්නත්‍රයට පැවැත්වීමෙන් දෘෂ්ටධර්මවශයෙන් මෙලොවදීම උදාරතර ආනිසංස හතරක් වැඩීම හේතුකොටගෙණ ඒ ශ්‍රද්ධාවන්තයාතෙමේ ලබන්නේයයි දතයුත්තේය;

“ වුත්තං හෙතං භගවතා.
“ අභිවාදන සීලිස්ස නිච්චං වුද්ධාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති ආයුවණ්ණො සුඛංබලන්ති.
පූජකොලභතෙපූජං වන්දකොපටිවන්දනං
යසොකිත්තිංචපප්පොති යොමිත්තානං නදූභති.

යනුහෙයින් සර්වඥයන්වූ භාග්‍යවත් බුදුරජානන්වහන්සේ විසින් වැඩීම් ආදියෙන් ලබණලද ආනිසංස මෙසේ වදාරණලද්දේය; තවද තුනුරුවන්ට වැඳීම හා පිදීම නිතර පැවැත්වීම ස්වභාවකොට ඇත්තාවූ සිබඳගුණවෘද්ධීයෝ පුදනලද්දාවූ බුද්ධාගමිකාර උපාසක උපාසිකාදීන්ට ඉහලෝකසඞ්ඛ්‍යාත මෙලොවදීම ආයු සය ශරීරවර්ණයයි කියනලද රූපලක්ෂණයද තමාගේ හිත කය දෙකට සැපහා ශරීර බලද යනමේ ආනිසංස හතරක් වැඩීම ලබන්නාහ. එතකුදු වුවත් තුනුරුවන් පුදන්නාහට වස්තුව ලැබීමද, පූජාලාභයද, ත්‍රිවිධරත්නයට වැඳීම හේතුකොටගෙණ තමන්ට නැවත වැඳුම් ලැබීම් ආදී යට පැමිණෙන්නේය; එසේහෙයින් පළමුකොට බුද්ධවන්දනාවේ ක්‍රමය දක්වම්හ.

“ ඉතිපිසො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති ”

යනමේ නවඅරහාදි බුද්ධගුණයෙන් යුක්තවූ අප බුදුරජානන්වහන්සේට වඳිම්, මේ නමස්කාරය වේවා කියා නමස්කාරපාඨය ආදී මේ ගාථා කියා වැඳයුත්තේය.

**නමොතස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

වන්දාමි චෙතියං සබ්බං සබ්බට්ඨානෙසු පතිට්ඨිතං
සාරිරිකධාතුමහාතෙජං බුද්ධරූපං සකලං සදා
සම්බුද්ධෙ අතීතෙච ජාතෙලොකුත්තමෙ සදා
සාදරෙන සරංකත්වා අහංවන්දාමි තෙජිනෙ
නිබ්බාණං ජීවිතංකත්වා තීයත්තනං අත්තසංවරං
බුද්ධං සරණපරියන්තං පත්ථයාමි සදාඅහං.

මේ බුද්ධවන්දනාවයි.

යස්සමූලෙ නිසින්නොව සබ්බාරිවිජයං අකා
පත්තොසබ්බඤ්ඤුතං සත්ථා වන්දෙතං බොධිපාදපං
මේ බෝධිවන්දනාවයි.

ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

එවං ස්වාක්ඛාතත්තා අයං ධම්මො තස්මා සන්දිට්ඨිකත්තා සන්දිට්ඨිකො අකාලිකත්තා අකාලිකො එහිපස්සිකත්තා එහිපස්සිකො ඔපනයිකත්තා ඔපනයිකො නිය්‍යානිකං ඉමං ධම්මං ඔපනයිකවසෙන සිරසානමාමි.

නිබ්බාණංජීවිතං කත්වා නිය්‍යන්තං අත්තසංවරං
ධම්මංසරණ පරියන්තං පජ්ජාමි සදා අහං
මේ ධම්මවන්දනාවයි.

සුපටිපන්නො භගවතො සාවකසංඝො උජුපටිපන්නො භගවතො සාවකසංඝො ඤායපටිපන්නො භගවතො සාවකසංඝො සාමීචිපටිපන්නො භගවතො සාවකසංඝො යදිදංචත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිසපුග්ගලා එසභගවතො සාවකසංඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

සබ්බසඞ්ඝ අත්තෙච ජාතෙ බුද්ධස්ස සාවකෙ
සාදරෙනසරංකත්වා අහංවන්දාමි තෙසදා,
නිබ්බාණං ජීවිතංකත්වා නිය්‍යන්තං අත්තසංවරං
සංඝංසරණපරියන්තං පජ්ජාමි සදාඅහං
මේ සංඝයා වැඳීමයි.

අභිවාදනසීලිස්ස නිච්චංබුද්ධාපචායිනො
චත්තාරො ධම්මාවඩ්ඪන්ති ආයුවණ්ණෝසුඛං බලන්ති.
ආකාසට්ඨාච භුම්මට්ඨා දෙවානාගා මහිද්ධිකා
පුඤ්ඤන්තංඅනුමොදිත්වා චිරංරක්ඛන්තු බුද්ධසාසනං
ආකාසට්ඨාච භුම්මට්ඨා දෙවානාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමොදිත්වා චිරංරක්ඛන්තු ධම්මදෙසනං
ආකාසට්ඨාච භුම්මට්ඨා දෙවානාගා මහිද්ධිකා
පුඤ්ඤන්තං අනුමොදිත්වා චිරංරක්ඛන්තු මංපරන්ති.
දෙවොවස්සතුකාලෙන සස්සසම්පත්තිහෙතු ච
පීතොභවතු ලොකො ච රාජා භවතු ධම්මිකො.

පංචිමෙ භික්ඛවෙ බලී කතමෙ පංච, පුබ්බපෙතබලිං ඤාතිබලිං දෙවතාබලිං රාජබලිං අතිථිබලිං ඉමෙ ඛො භික්ඛවෙ පංචබලීති එත්ථ පුබ්බපෙතබලීනාම කාලකතානං පුබ්බපෙතානං දක්ඛිණානුමොදනං ඤාතිබලීනාම ඤාතිසංගහං දෙවතාබලීනාම දෙවතානංපත්තිදානං උදාහු දෙවතානං දක්ඛිණානුප්පදානං තථාහි.

තස්මාහිභූතානි සාමෙථ සබ්බෙ
මෙත්තං කරොථ මානුසියාපජාය,
දිවාචරත්තො ච හරන්ති යෙබලිං
තස්මාහිනෙරක්ඛථ අප්පමත්තා.

රතනසුත්තෙ ඉමිස්සාය ගාථාය දිට්ඨධම්මිකත්ථං සන්ධායදෙවතාබලිං කාතුංවට්ටතීති භගවතාවුත්තත්තා දෙවතානුකම්පිත සුත්තෙපි සත්ථා එතදවොච.

යාතත්ථ දෙවතාආසුං තාසං දක්ඛිණමාදිසෙ
තාපූජිතා පූජයන්ති මානිතාමානයන්තිනං,
තතොනං අනුකම්පන්ති මාතා පුත්තංව ඔරසං
දෙවතානුකම්පිතොපොසො සදාභද්‍රානිපස්සතීති.

“ රාජබලිනාම රාජානං වඩ්ඪුදානං අතිථි බලිනාම ආගන්තුපට්ඨානං” එ පස්වැදෑරුම්වූ බලිකර්මය මෙසේ දතයුත්තේය. භික්ඛවෙ, මහණෙනි; ඉමෙපංචබලී, මේ බලිපහක්වෙති; කතමෙ පංච, එ බලිපහ කවරේද; “පුබ්බෙ ච සො පෙතොචාති පුබ්බපෙතො පුබ්බපෙතානං බලි පුබ්බපෙතබලි” පූර්වප්‍රෙතයන් සඳහා දියයුතුපින්දීම් සඞ්ඛ්‍යාත බලියද; ඤාතිච බලිංච, ඤාතිබලි, නෑයින්ට සංග්‍රහකිරීමද; දෙවො එව දෙවතා දෙවතාච බලිංච දෙවතා බලි, මෙලොවඋපකාර නකා දෙවියන්ට දියයුතු දෙවපූජාවද; රාජා ච බලිංච රාජබලි, රජහටදියයුතු සුන්කම්ද; අතිථිචබලිං ච අතිථිබලි, ආගන්තුකයන්ට උපකාරකිරීමද; භික්ඛවෙ, මහණෙනි, ඉමෙබො, මේවනාහි; පංචබලීති, බලිපහයයි වදාළසේක. එත්ථ, මෙහි; දෙවතාබලිං ඉති, දෙවතාබලි යනු; දෙවතානං, දෙවියන්ට; පත්තිදානං, පින්දීමයි; උදාහු, නොහොත්; දෙවතානං, දෙවියන්ට; දක්ඛිණානුප්පදානං, දෙවපූජාවදීමද; මෙලොව ප්‍රයොජනසදහා ගෘහස්ථයන් විසින් නොයෙක් උපද්‍රා නිවාරණයපිණිස කරණලද ලොකචාරිත්‍රය වන්නේමැයි “ දිසානමස්සිතුං නවට්ටති භූතබලිං කාතුං නවට්ටති ” යනුවදාළේ භික්ෂූන්ට බව දතයුතු. වුත්තං හෙතං භගවතා එතං, ඒ දෙවපූජාව ඇතිබවට මේ උදාහරණය—භගවතා, භාග්‍යවත් බුදුරජානන්වහන්සේ විසින්; වුත්තං, රුවන්සූත්‍රයෙහි මෙසේ වදාරණලද්දේය. තස්මාහි, එහෙයින්; වනාහි; භූතා, අමනුෂ්‍යවූතෙපි; නිසාමෙථ, මාගේ දම්දෙසුම් අසව්; සබ්බෙ,

තෙපි සියල්ලෙ; මානුසියාපජාය, මනුෂ්‍යප්‍රජාවකෙරෙහි; මෙත්තං කරොථ, මෛත්‍රීකරව්; දිවාච, දවල්ද; රත්තොච, රාත්‍රියෙහිද; යෙ, යමෙක්තුමූ; බලිංහරනති, පුදබාරගණිද්ද; තස්මාහි, එහෙ[illegible]නංග; අප්පමත්තා, අප්‍රමාදවූතෙපි; හේ පුන්‍යානුමොදනාවෙනිද; දෙවපූජා වෙනිද, ආසාඇතාවූ ඒ මනුෂ්‍යයන්; රක්ඛථ, රකිව්යයි; වදාළසේක.

තවද සම්‍යක්දෘෂ්ටි බුද්ධාගම්කාරයන් විසින් මෙලොව ප්‍රයොජන සඳහා දේවපූජාව පැවැත්වීම වරදනැතිබව මේ දෙවතානුකම්පිත සූත්‍රදෙසනාවෙන්ද දතමැනවි. යාදෙවතා, යම්දේවතාවො; ආසුං, යම්තැනක විසීමවූද; තත්‍ථ, එහි අරගෙනතනාවූ; පොසං, හේ දෙවයා වන්ට; දක්ඛිණං දෙවපූජාව; ආදිසෙ, දක්වීම වන්නේය; පූජිතා, ඒ මනුෂ්‍යයන් විසින් පුදනලද්දවූ; තා, හේදෙවතාවො; පූජයන්ති, ඔවුන් පුදත්; මානිතා, බුහුමන්කරණලද්දවූ; තං, ඕහට; මානයන්ති බුහුමන්කරත්; තතො, එහෙයින්; ඔරසංපුත්තං, එකපුත්‍රයෙක් ඇතනාවූ; මාතාඉව, මවක්මෙන්; තං, ඕහට; අනුකම්පන්ති, කරුණා කරත්; දෙවතානුකම්පිතො, දෙවියන් විසින් අනුකම්පාකරණලද; පොසො,, පුරුෂයා; සදා, හැමකල්හිම; භද්‍රානි. යහපත්වූ අභිවෘද්ධි යක්; පස්සති, දක්නේයයි වදාළසේක. මෙසේ දේවතානුකම්පිත සූත්‍රයෙහි වදාලහෙයින් දෙවතාවො යම්තැනෙක්හි අරගෙනතාහුද, යමෙක් එහි එලඹ ඒ දේවතාවන්ට දෙවපූජාව දක්වූකල්හි ඒ ප්‍රමු දිත සිත්ඇති දෙවියන් විසින් ප්‍රත්‍යුපකාරවශයෙන් දෙවපූජකයා හට උපකාරකරණලද්දේයයි වදාළසේක.

ඊට උදාහරණ මෙසේ දතයුතු.

යම්සේ මෑනියෝ සවකීය පුත්‍රයා රක්‍ෂාකිරීම මෙන් මෙසේ දෙවි යන්ට පින්දීමෙන්ද, දෙවපූජාවෙන්ද, උපකාරකරණලද දෙවපූජ කයා මෙලොව සියලු උපද්‍ර දූරිභූතකොට දෙවියන් විසින් උපකාර කරමින් ආරක්‍ෂාකරණලදී; මේ සාසනසුද්ධදීපනියෙහි ප්‍රථම වන්‍දනා පරිච්ඡේදය කියා නිමවනලද්දේය.

වන්‍දනා පරිච්ඡේදයයි.

---

තවද මේ සද්ධර්මාදසයෙහි සරණාගමණ පරිච්ඡේදය කෙසේදයත්?

“එත්‍ථ පන සරණාගමනස්ස පභෙදෙ එවං මනොරථ පූරණී නාම අට්ඨකථායං වුත්තො එත්‍ථපන” මෙහිවනාහි සරණාගමනස්ස, සරණ ගමනයෙහි; පභෙදෙ, වෙනස; මනොරථපූරණී නාම; මනොරථපූර ණීනම්; අට්ඨකථායං, අර්ථකථාවේ; එවංවුත්තං, මෙසේ කියනලද්දේ ය; “ඉධසරණාගමණං ලොකිය ලොකුත්තරවසෙන ද්විධාවුච්චතෙ” ඉධ, මෙහි; සරණාගමණං, සරණාගමනය; ලොකිය ලොකුත්තරව

ශයන, ලෞකිකලෝකව්‍යවහාරවශයෙන්; විධා දෙපරිද්දෙන්; වුච්ච
තෙ, කියනුලැබේ. "එතං ලොකියස්ස සරණාගමනස්ස දුවිධො
හොති සාවජ්ජො ච අනවජ්ජො චෙති" එතං, මෙහි; ලෞකියස්ස
සරණාගමනස්ස, ලෞකිකසරණාගමණයාගේ; සාවජ්ජාව, වැරදි
ඇත්තාවූද; අනවජ්ජාව, වැරදිනැත්තාවූද; හොති, බිදීම; දුවිධො,
දෙයාකාරයි. "තත්‍ථ සාවජ්ජා නාම අඤ්ඤසත්‍ථාරාදිසු අත්තසංනී
ය්‍යාතනං" තත්‍ථ, එහි; සාවජ්ජනාම, වැරදිඇති සරණයාමනම්;
අඤ්ඤසත්‍ථාරාදිසු, මේ සර්‍වඥසාසනෙන් පිට; (වෙන ආගම්වල සිටින
අන්‍යගුරුවරාදීන් කෙරෙහි); අත්තසංනියෳාතනං, තමාගේ ආත්ම
සංඛ්‍යාත ශරීරය පරිත්‍යාගකිරීම් වසයෙන් පාවාදීමයි; "එත්‍ථ අන
වජ්ජ අත්තසංනීය්‍යාතනං නාම" එත්‍ථ, මෙහි; අනවජ්ජ, නිරවද්‍යවූ;
අත්තසංනීය්‍යාතනංනාම, ආත්මපරිත්‍යාගනම්. "අජ්ජාදිංකත්වා
අහං අත්තානං බුද්ධස්සනියෳාතෙමි ධම්මස්ස සංඝස්ස අත්තානං නියෳා
තෙමි ජීවිතපරියන්තං බුද්ධංසරණංගච්ඡාමි ජීවිතපරියන්තං ධම්මං
සරණංගච්ඡාමි ජීවිතපරියන්තං සංඝං සරණං ගච්ඡාමිති එවං බුද්ධා
දීනං අත්තපරිච්චජනං ඉදං අත්තසංනීය්‍යාතන සරණාගමනං නාම."

තවද උපාසකභාවය පිහිටා සර්‍වඥසාසනයට ඇතුළත්වීමෙන් බුද්ධා
ගම්කාරයෙක් වීම පිණිස නියමකර වදාරණලද මේ ආත්මසංනියෳා
යතන සරණයාමේ "අජ්ජාදිංකත්වා" යනාදි වාක්‍ය තේරුම දත
බුද්ධාගම්කාරයෙක් වියයුතෙනය—අද පටන් මම මාගේ ආත්මය
බුදුරජානන්වහන්සේට පාවාදෙමි, එසේම ධර්‍මයටද, සංඝයාටද, පරි
ත්‍යාගකරමි, මාගේ දිවි කෙළවරදක්වා බුදුන් සරණ යමි, දහම්
සරණ යමි, සඟසරණ යමි, කියා මෙසේ බුද්ධාදි රත්නත්‍රයට තමාගේ
ආත්මපරිත්‍යාගකොට දිවිපිදීමෙන් සරණයාම ආත්මසංනියෳාතන
සරණාගමණය නම් වන්නේය. "තප්පරායන සරණාගමනං නාම
අජ්ජාදිංකත්වා අහං බුද්ධපරායනො ධම්මපරායනො සංඝපරායනො
තිදං සරණාගමනං තප්පරායන සරණාගමනං නාම" තවද බුද්ධාදි
ත්‍රිවිධරත්නය උතුම් බව දත සසර සයුරෙන් එතර වීමට මට ඒ බුදු
රුවන් ආදි තුනුරුවන් නමැති රත්න නාවිකාව උතුම්වන්නේයයි
සිතා තප්පරායන සරණාගමනය නම්, මෙසේයයි දත අදපටන් මම
බුදුන් දහම් සංඝයා උතුම්කොට එතුනුරුවන් සරණයමි කියා තප්ප
රායන සරණාගමනෙන් බුද්ධාගමට ඇතුළත්වියයුතෙනය. "සිස්ස
භාවූපගම සරණාගමනං නාම අජ්ජාදිංකත්වා අහං බුද්ධස්ස අන්තෙ
වාසිකො ධම්මස්ස සංඝස්ස අන්තෙවාසිකො තිදං සරණාගමනං
සිස්සභාවූපගම සරණාගමනං නාම." බුද්ධාදී රත්නත්‍රයට අතවැස්
සෙක්වීමෙන් සරණයාම ශිෂ්‍යභාවූපගම සරණාගමනනම් වේ; ඒ සර
ණාගමනයනම් අදපටන් මම බුදුරජානන්වහන්සේට අතවැස්සෙක්

හෙමි, ධර්මයණිද සංඝයාටද අතවැසෙක් වෙමි කියා සරණයාම්-ශිෂ්‍යභාවූපගම සරණාගමනයනම් වන්නේය, මේ සරණාගමන් ශිෂ්‍යභාවූපගම සරණාගමනය නම්—“පනිපාතසරණාගමනං නාම අජ්ජාදිං කත්වා අහං අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං බුද්ධාදීනංයෙව තිණ්ණං වත්ථූනං කරොමිති එවංධාරෙථාති පරමනිපච්චාකාරො ඉදංපනිපාතසරණාගමනං නාම” තවද නිර්වාණය ප්‍රත්‍යක්ෂකිරීමපිණිස බුද්ධාදී රත්නත්‍රයට නමස්කාරකොට සරණයනනාවූ ප්‍රනිපාතසරණාගමනය කෙසේදයත්? අදපටන් මම නිවන් සිද්ධකරගැනීමපිණිස වැඳීම උන් ආසනයෙන් නැගිටීම ඇඳිලිබැඳීම සටන්කටයුතුයයි කියනලද හික්මීම බුද්ධාදී රත්නත්‍රයටම කරමි කියා මා ධාරණයකරවාලූ මැනවැයි යන උත්තම නමස්කාරය කටයුතු...මේ වැඳීම සඞ්ඛ්‍යාත ප්‍රනිපාතසරණාගමනය නම් වේ.

“ඉමිනා මග්ගෙන සබ්බෙව දෙවමනුස්සා උපාසකභාවෙනවා පබ්බජිත භාවෙනවා සාසනං ඔතරන්ති ඉදං ලොකියසරණාගමනං නාම” යනුහෙයින් මෙසේ දක්වනලද සතරවැදෑරුම්වූ මේ සරණාගමණය හෙතුකොටගෙණ සියලු දිව්‍යමනුෂ්‍යයෝ උපාසක භාවයෙන් හෝ පැවිදිභාවයෙන් හෝ සර්වඥසාසනයට ඇතුළුත්වෙති—එසේ හෙයින් කියනලදී. “බුද්ධං උපාසන්ති උපාසකො ධම්මං උපාසන්ති උපාසකො සංඝං උපාසන්ති උපාසකො යතොඛො මහානාම උපාසකො බුද්ධං සරණං ගතොහොති ධම්මංසරණං ගතොහොති සංඝංසරණං ගතොහොති එත්තාවතානු ඛො මහානාම උපාසකොති” බුද්ධං, චතුස්සත්‍යාවබොධයකළාවූ සර්වඥයන්වහන්සේ සරණං, පිහිටකොට; ගච්ඡාමි, නිර්වාණයට පැමිණෙමි; ධම්මං, නෛර්යාණික ධර්මය; සරණං පිහිටකොට; ගච්ඡාමි, සුගතියට යමි; සංඝං, ආර්යසංඝරත්නය; සරණං, පිහිටකොට; ගච්ඡාමි, සුවයට පැමිණෙමි; දුතියම්පි, දෙවනුවද; බුද්ධං, බුදුරජානන්වහන්සේ; සරණං, පිහිටකොට; ගච්ඡාමි,යමි; දුතියම්පි, දෙවනුවද; ධම්මං, ධර්මය; සරණං, පිහිටකොට; ගච්ඡාමි, යමි; දුතියම්පි, දෙවනුවද; සඞ්ඝං, සංඝයා; සරණං, පිහිටකොට; ගච්ඡාමි, යමි; තතියම්පි, තෙවනුවද; බුද්ධං, සර්වඥයා; සරණං, ප්‍රතිෂ්ඨාකොට; ගච්ඡාමි, යමි; තතියම්පි, තුන්වෙනුවද; ධම්මං, ධර්මය; සරණං, ප්‍රතිෂ්ඨාකොට; ගච්ඡාමි, යමි; තතියම්පි, තෙවනුවත්; සඞ්ඝං, සංඝයා; සරණං, ප්‍රතිෂ්ඨාකොට; ගච්ඡාමි, යමි.

“බුද්ධස්සසරණං බුද්ධංසරණං තං බුද්ධං අහං සරණං ගච්ඡාමි ධම්මස්ස සරණං ධම්මංසරණං තං ධම්මං අහං සරණංගච්ඡාමි—සඞ්ඝස්ස සරණං සඞ්ඝං සරණං තං සංඝං අහං සරණංගච්ඡාමි”

යනුහෙයින් බුද්ධාදී රත්නත්‍රය සරණයාමෙහි ආනිසන්ස මෙහි මඳක් දක්වනුලැබේ. “එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං

ආයස්මා මහාමොග්ගල්ලානො එතදවොච—සාධු ඛො දෙවානමින්ද බුද්ධං සරණාගමනං බුද්ධං සරණාගමණහෙතු ඛො පන දෙවානමින්ද එවමිධෙකච්චෙ සත්තා කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගංලොකං උපපජ්ජන්ති—පෙ—දිබ්බෙහි ඵොට්ඨබ්බෙහීති "

යනුහෙයින් බුදුන් දහම් සඞ්ඝයා සරණකොට යාම හේතුකොටගෙණ ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි දිව්‍යලෝකයෙහි උපදින්නාහුයයි ආයුෂමත්වූ වම්සව් මුගලන් සුගතපුත්‍රතෙමේ ශක්‍රදෙව්රජහට වදාළසේක.

එසේහෙයින් වදාළහ බුදුහු.

යොචබුද්ධංච ධම්මංච සංඝංච සරණංගතො
චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති.

එතංඛො සරණං ඛෙමං එතංසරණමුත්තමං
එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චතීති.

තවද යමෙක් තුනුරුවන් සරණගියේද, එසම්මවායෙන් ප්‍රඥව හෙතුකොටගෙණ දුක්ඛාදී චතුරායඝ්සත්‍යයන් දැකීම වන්නේයයි වදාළසේක...එසේහෙයින් භවත්නි, අප බුදුරජානන් වහන්සේගේද, සුදෙසිත ශ්‍රීසද්ධර්මයාගේද, ආයඝ්මහාසඞ්ඝරත්නයාගේද, මේ සරණාගමනය උතුම්බවද, අනේක ආනිසංසද, ප්‍රඥවෙන් දැන ඒ සරණාගමනයට පැමිණ ඒ උත්තම සරණ ප්‍රතිෂ්ඨාකොටගෙණ සකල සංසාරදුක්ඛයෙන් මිදීමට උත්සාහ කටයුතු.

මෙසේ පිහිටාගන්නාලද ලෞකික සරණයාගේ භෙදයකුදු ඇත ඒ සරණය බිඳීමේ ආකාරය මේ දෙසනා උදාහරණයෙන් දතුයුතු.

"එත්ථ පන ලොකියස්ස සරණාගමනස්ස භෙදො ජීවිතක්ඛයෙනවා අඤ්ඤසත්ථාරාදිසු අනන්තසංනීයතනෙනවා භිජ්ජති" මෙහි ලෞකික සරණයාගේ බිඳීම වනාහි තමාගේ ජීවිතය ක්ෂයවීමෙන් හෝ මේ බුධාගමෙන් පිට සමයවාදී ගුරුවරාදීන් කෙරෙහි දිව්පිදීමෙන් වැඳීමෙන් හෝ දේවාගම් ඇදහීමෙන් හෝ සර්‍වඥසාසනයෙන් බාහිර වීමෙන් සරණය බිඳෙන්නේය; තවද චාරිත්‍රවශයෙන් මෙලොව අභිවෘර්ධිසඳහා දෙවියන්ට හා මාතෘපිතෘ රාජරාජාදීන්ට වැඳීමෙන් හෝ සත්කාරකිරීමෙන්ද තමාගේ සරණභෙදය නොවන්නේය.

ඊට උදාහරණ මෙසේ දතයුතු.

තස්මාහිතෙනමස්සෙය්‍ය සක්කාරෙය්‍යාථ පණ්ඩිතො
අන්නෙන අථ පානෙන වත්ථෙන සයනෙනච

නවද දුස්සීල පුද්ගලයා නිස්සරණනිස්සීලයෙන් යුත් හිස් පුද්ගලයෙක් බව සමන්තපාසාදිකා විනෙඅටුවාවේ වදාරණලද මේ උදාහරණයෙන් දතමැනවි.

"අපරිසුද්ධානඤ්ච පරිසාහි වචනං සුත්වා යෙව හිතෙන පක්කමිතබ්බං සියා එවං අපක්කමිත්වා යාවබාහාගහනාපි නාම සො මොඝපුරිසො ආගමෙස්සති අච්ඡරියමිදං තාදසෙසති"

යනුහෙයින් මේ මෝඝපුරිසවාදය බුදුරජානන්වහන්සේ විසින් ඒ දුස්සීලයා හිස්පුද්ගලයා බැවින් වදාරණලද්දේය. "හෙට්ඨිම කොටියා තිසරණගතො උපාසකො සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො තස්මිං දින්නදානම්පි අසංඛෙය්‍ය අප්පමෙය්‍යානි" වදාළහෙයින් සරණගතයාට දෙනලද දානයෙහි ආනිසංස ප්‍රමාණනැත්තේය, "යෙසං භොජන පතිගණ්හාති චීවරපිණ්ඩපාත සෙනාසන ගිලාන පච්චය භෙසජ්ජපරික්ඛාරං තෙසං න මහප්ඵලං හොති න මහානිසංසං" යනු අඞ්ගුත්තර පාළියෙහි දුස්සීලයාට දන්දීමෙහි ආනිසංස ටික බැවින් දුස්සීලයාට තිසරණය නැත්තේමැයි දතයුතු.

මේ සාසනසුද්ධදීපනියෙහි දෙවෙනි සරණාගමන පරිච්ඡේදය නිමි.

සරණාගමන පරිච්ඡේදයයි.

---

නවද මේ සද්ධම්මප්‍රකරණයෙහි තුන්වෙනි සීලපරිච්ඡේදය කෙසේ දයත්.... එව් සීලං නාම චෙතනාසීලං චෙතසිකං සීලං සංවරොසීලං අවීතික්කමොසීලං පරියන්තසීලං අපරියන්තසීලං ගහට්ඨසීලං පබ්බජ්ජාසීලං චුල්ලසීලං මජ්ඣිමසීලං මහාසීලං පාතිමොක්ඛසංවරසීලං ඉන්ද්‍රියසංවරසීලං ආජීවපාරිසුද්ධිසීලං පච්චයසන්නිස්සිතසීලන්ති පන්නරසමො.... නවද මෙහි—සීලං කිං, සීලං යනු කවරේද; කෙන ට්ඨෙන, කවරඅර්ථයක්කරණකොටගෙණ; සීලනන්ති, සීලයසිකියනු ලැබේද; එව්සීලං නාමසභාවො, මෙහි සීලයනම් ස්වභාවයි; තත්කානි පමානානි සීලානි, මෙහි කොපමන සිල්ඇත්තාහුද; ගහට්ඨසීලං පබ්බජ්ජාසීලානි, ගෘහස්ථසීලය පැවිදිසීලයකියා; වෙසීලානි, සීලයො දෙවැදෑරුම්වෙති; විත්ථාරතොපන, විස්තරවසයෙන්වනාහි; චෙතනාසීලාදි, චෙතනාසීලයආදිකොට; සීලානි,සීලයො; පන්නරසමො, පසළොස්වැදෑරුම්වෙති; තත්තෙසුසීලෙසු, ඒ සීලයන්අතුරෙන්; චෙතනාසීලං, චෙතනාසීලය; ආදිවුච්චතෙ, පළමුකො-කියනුලැබේ; පාණාතිපාතාදි, ප්‍රාණඝාත අදත්තාදාන කාමිථ්‍යාචාර මුසාවාද කේලම්කීම රළුබස්කීම ප්‍රලාපකීම යන; සත්තඅකුසලකම්මපථෙහි, අකුසල්හනෙන්; විරමනං, වෙන්වීම; චේතනාසීලංනාම, චෙතනාසීලය නම් වේ—එව් චෙතසිකංසීලං නාම, මෙහි චෛතසිකසීලයනම්;

පාණාතිපාතාදි, ප්‍රාණඝාතයආදිකොටඇති; අදින්නාදානය කාමමිථ්‍යා චාරය බොරුකීම කේලාම්කීම පරුෂබස්කීම ප්‍රලාපය ලොභය ක්‍රොධය මිථ්‍යාදෘෂ්ටිය යන; දසාකුසල කම්මපථෙහි, අකුසල්දහයෙන්; විරති, වෙන්වීම; වුත්තා, වදාරණලද්දහු; සංවරොසීලංනාම, සංවරසීලය නම් කවරේද; පංචවිධෙන සංවරොදට්ඨබ්බො, පස්පරිද්දෙන් සීලසං වරය දතයුතු; පාතිමොක්ඛසංවරො, නිර්වාණය සාක්ෂාත් ක්‍රීම සඳහා රක්ෂාකටයුතු ප්‍රාතිමොක්ෂසංවරසීලයද; සතිසංවරො, සිහි යෙන් ආවරණ කටයුතු සතිසංවරයද; ඤාණසංවරො, නුවණින් කෙ ලෙස්වැළැක්මම කටයුතු ඤාණසංවරයද; ඛන්තිසංවරො, ඉවසීමෙන් පාපාවරණය කටයුතුවූ ඛන්තිසංවරයද; විරියසංවරොහි, උත්සාහ යෙන් කෙලසාවරණය කටයුතුවූ විරියසංවරයද; යන මේ පස්ආකා රයෙන් සීලපාලනයකටයුතු—අවීතික්කමොසීලං නාම, සමාදම්වන ලද සීලයාගේ කැඩීම්පිණිස කයින් තෙපුලෙන් පව්කිරීමට අවකාස නොදීමයයි කියනලද කායික වාචසික දෙක නොඉක්මීම අවීතික්‍රම සීලයනම් වේ—එවරූපානි සීලානි, මේ සවරූපඇතිසීලයො; චිත්ත ස්ස අවිප්පටිසාරාය සංවත්තන්ති, චිත්තයාගේ කාළනොකිරීමපිණිස දෝහෝනොහොත් චිත්තයාගේ පසුනොබැසීමපිණිසද; පාමොජ්ජාය ප්‍රමොදාඛ්‍යසඞ්ඛ්‍යාත; පීතියා, චිත්තප්‍රීතියපිණිසද; පස්සද්ධියා; කෙලෙස් සන්සිඳවීමපිණිසද; සොමනස්සාතං, සෞම්‍යමනස්‍යයන්ගේ; ආසෙව නාය; ආශ්‍රයපිණිසද; බාහුල්ලතාය, බාහුල්‍යවූනිගියපිණිසද; අලංකා රාය, සීලනමැති ආභරණලා සැරහීමපිණිසද; පරික්ඛාරාය; එමපරි ෂ්කාරය පිණිසද; පරිවාරාය, එම සීලනමැති පිරිවර පිණිසද; පාරි පූරියා; එමසීලයාගේ සම්පූර්ණබවපිණිසද; එකන්තනිබ්බිදාය, එකා න්තයෙන් සසර කළකිරීමපිණිසද; නිරොධාය, සියලුදුක් නැසීමපි ණිසද; උපසමාය, කෙලසයන්ගේ ව්‍යපසමනයපිණිසද; අභිඤ්ඤාය, සත්‍යප්‍රතිවෙධය පිණිසද; සම්බොධාය, චතුස්සත්‍යයන්ගේ අවබොධය පිණිසද; නිබ්බාණාය, නිරුපධිසෙස නිර්වාණධාතු දක්නාපිණිස; සං වත්තන්ති, පවත්නාහුයයි; වදාළසේක...නවද ඒ පසලොස්වැදෑරුම්වූ සීලයන්අතුරෙන් පරියන්තසීලං අපරියන්තසීලං යන මේ දෙයා කාර සීලයො ග්‍රහස්ථසීලයෙහිද ප්‍රව්‍රජ්‍යාසීලයෙහිද ඇතුලත්කර වදාළහෙයින් එහි විස්තර මෙසේ දක්වමු—ඒ දිප්‍රකාරසීලයන් අතු රෙන් ගිහිජනයා පිළිබඳවූ අටසීලය පර්‍යන්තසීලය නම්වේ—ඒ අට සීලයෙහි අර්ථ මෙසේ දතයුතු—පාණාතිපාතා, සතුන්නැසීමෙන්; වෙරමණී, වෙන්වූ; සික්ඛාපදං, සික්ෂාපදය සිල්පදය; සමාදියාමි, සමාදන්වෙමි කියාද; අදින්නාදානා, නුදුන්වස්තු හොරහිතෙන් ගැණී මෙන්; වෙරමණී, වෙන්වූ; සික්ඛාපදං, සික්ෂාපදය, සිල්පදය; සමා දියාමි, සමාදම්වෙමි කියාද; අබ්‍රහ්මචරියා, උතුම්නොවනනාවූ කාම

යෙහි හැසිරීමෙන්; වෙරමණී, වෙන්වූ; සික්ඛාපදං, සිල්පදය; සමාදියාමි, සමාදම්වෙමිකියාද; මුසාවාදා, බොරුකීමෙන්; වෙරමණී, වෙන්වූ; සික්ඛාපදං, සිල්පදය; සමාදියාමි, සමාදන්වෙමි කියාද; සුරාමෙරය මජ්ජපමාදට්ඨානා, මත්විමටද ප්‍රමාදයටද හෙතුවූ රහ මෙරපානය කිරීමෙන්; වෙරමණී, වෙන්වූ; සික්ඛාපදං, සික්ෂාපදය; සමාදියාමි, සමාදම්වෙමි කියාද; විකාලභොජනා, විකල් බොජුනෙන්; වෙරමණී, වෙන්වූ; සික්ඛාපදං, සිල්පදය; සමාදියාමි, සමාදන්වෙමි කියාද; නච්ච, නැටීමද; ගීත, ගීකීමද; වාදිත, බෙරගැසීමද; විසූකදස්සන, නැටුම්බැලීමද; මාලා, මල්දම්පැළඳීමද; ගන්ධවිලෙපනධාරණ, සුවඳවිලවුන්දැරීමද; මණ්ඩන, ආභරණලා සැරහීමෙන් ශරීරය අලඞ්කාරකිරීමද; විභූසන, වස්ත්‍රාදියෙන් අඩුතැන් පිරීමෙන් විශෙෂයෙන් ශරීරය නැවත නැවත සරහීමද යන; ඨානා, කාරණයෙන්; වෙරමණී, වෙන්වූ; සික්ඛාපදං, සිල්පදය; සමාදියාමි, සමාදම්වෙමිකියාද; උච්චාසයනා, වඩුරියනෙන් උස්පාඇති උස්ආසනයෙන්; වෙරමණී, වෙන්වීමද; මහාසයනා, විසිතුරුවූ රූප හා මල්ඇති පට්ටසත්‍රාදිය අතුරණලද මහත්වූ මාහැඟි ආසනයෙන්; වෙරමණී, වෙන්වූ; සික්ඛාපදං, සික්ෂාපදය; සමාදියාමි, සමාදම්වෙමි කියාද; මෙසේ මෙණෙනිකිරීමෙන් අටසිලය සමාදම්වීම දතයුතු.

තවද ඒ අටසිලයෙහි විද්‍යමානවූ අංගඅට මෙසේ දතයුතුයි—අඛණ්ඩානි, කැඩීමක්නැත්තාවූ; අච්ඡිද්දානි, සිදුරුනැත්තාවූ; අසබලානි, කැලැල් නැත්තාවූ; අකම්මාසානි, තිත්පැලහි නැත්තාවූ; භුජිස්සානි, නිදහස්ඇත්තාවූ; විඤ්ඤුප්පසත්ථානි, නුවනැත්තන් විසින් පසස්නාලද්දාවූ; අපරාමට්ඨානි, පරාමර්ශනය නොකොට හැක්කාවූ; සමාධිසංවත්තනිකානි, චිත්තසමාධිය ඇත්තාවූ, මේ අටසීලයෙහි අඞ්ගඅට නුවනින්දැන අටසිලය රැක්සාසුකෙතය; එසේහෙයින් ගිහිසීලය තෙමේ තනිව සමාදන්වීම අනුදන්බැවින් චෛත්‍යයක් කරා එළඹ වත්සපයා වැද මෙසේ අටසීලය සමාදන්වීම දතයුතු—බුද්ධංසරණංගච්ඡාමි—පෙ—තතියම්පි සංඝංසරණං ගච්ඡාමි—අහම්පජ්ජ ඉමංච දිවසං පාණාතිපාතාවෙරමණී සික්ඛාපදං සමාදියාමි—අහම්පජ්ජ ඉමංච දිවසං අදින්නාදානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි—අහම්පජ්ජ ඉමංච දිවසං අබ්‍රහ්මචරියා වෙරමණී සික්ඛාපදං සමාදියාමි—අහම්පජ්ජ ඉමංච දිවසං මුසාවාදා වෙරමණී සික්ඛාපදං සමාදියාමි—අහම්පජ්ජ ඉමංච දිවසං සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි—අහම්පජ්ජ ඉමංච දිවසං විකාල භොජනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි—අහම්පජ්ජ ඉමංච දිවසං නච්චගීත වාදිත විසූකදස්සන මාලාගන්ධ විලෙපන ධාරණ

මංඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි—අහම්පජ්ජ ඉමංච දිවසං උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.

සවස සීලසමාදානය මෙසේ දතයුතු—බුද්ධංසරණංගච්ඡාමි—පෙ—තතියම්පි සංඝං සරණංගච්ඡාමි—අහම්පජ්ජ ඉමංච රත්තිං පාණාතිපාතා වෙරමණීසික්ඛාපදං සමාදියාමි—පෙ—උච්චාසයන මහාසයනා වෙරමණී සික්ඛාපදං සමාදියාමි—භික්ෂූකෙනෙකුගෙන් අටසීලය සමාදන්වෙන කල්හි වාක්‍යයෙන් ගතයුතුක්‍රමය෴ඔකාස අහම්භන්තෙ තිසරණෙන සද්ධිං අට්ඨඞ්ගසීලං යාචාමි, ඉමස්මිං උපොසථෙ අජ්ජ ඉමංච දිවසං රක්ඛණත්ථාය කාරුඤ්ඤං කත්වා අට්ඨඞ්ගසීලං දෙථ මෙභන්තෙ—දුතියම්පි අහම්භන්තෙ තිසරණෙන සද්ධිං අට්ඨඞ්ග සීලං යාචාමි; ඉමස්මිං උපොසථෙ අජ්ජ ඉමංච දිවසං රක්ඛණත්ථාය කාරුඤ්ඤං කත්වා අට්ඨඞ්ගසීලං දෙථ මෙභන්තෙ—තතියම්පි අහං භන්තෙ තිසරණෙන සද්ධිං අට්ඨඞ්ගසීලං යාචාමි, ඉමස්මිං උපොසථෙ අජ්ජ ඉමංච දිවසං රක්ඛණත්ථාය කාරුඤ්ඤං කත්වා අට්ඨඞ්ගසීලං දෙථ මෙභන්තෙ.

සවස උපොසථසීලය ගන්නා වාක්‍ය මෙසේ දතයුතු—ඔකාස අහං භන්තෙ තිසරණෙන සද්ධිං අට්ඨඞ්ගසීලං යාචාමි; ඉමස්මිං උපොසථෙ අජ්ජ ඉමංච රත්තිං රක්ඛණත්ථාය කාරුඤ්ඤං කත්වා අට්ඨඞ්ගසීලං දෙථ මෙභන්තෙ—දුති—පෙ—භන්තෙ෴තති—පෙ—භන්තෙ෴පංචසීලය සමාදම්වෙන වාක්‍ය මෙසේදතයුතු—ඔකාසඅහංභන්තෙ තිසරණෙන සද්ධිං පංචසීලං යාචාමි, නිච්චසීලවසෙන රක්ඛණත්ථාය කාරුඤ්ඤං කත්වා පංචසීලං දෙථ මෙභන්තෙ෴දුතියම්පි අහං—පෙ—භන්තෙ෴ තති—පෙ—භන්තෙ෴

පදවිග්ගහො.

පාණානං අතිපාතො පාණාතිපාතො එත්ථ පාණඝාතස්සෙතං අධිවචනං ඝාතොති මාරණං තම්හා පාණාතිපාතා වෙරමණීති කස්මා වෙරමණී පාණාතිපාතස්මා වෙරමණී විරමන මෙව වෙරමණී පාණාතිපාතා විරමනෙසුත්තො වෙරමණී පාණාතිපාතා වෙරමණියා භාවො විරමනං සාවෙරමණී—සික්ඛාච පදංච සික්ඛාපදං සික්ඛත්තීති සික්ඛාපජ්ජන්තීති පදං සමාදියත්තීති සමාදිතං සික්ඛාපදං අහං සමාදියාමි—නදින්නානං අදින්නානං අදින්නස්ස ආදානං අදින්නාදානං නදීයත්තීති අදින්නං තම්හා අදින්නාදානා වෙරමණීසික්ඛාපදං අහං සමාදියාමි—නබ්‍රහ්මචරියං අබ්‍රහ්මචරියං නත්ථි බ්‍රහ්මචරියං එතස්සාති අබ්‍රහ්මචරියං තස්මා අබ්‍රහ්මචරියා විරමාමි, මුසාවදන්තීති මුසාවාදෙ මුසවචනස්සෙතං අධිවචනං යාචාචා කථිතා මුච්ඡාසා මුසාති වුච්චතෙ තම්හා මුසාවාද

වෙරමණී සික්ඛාපදං අහං සමාදියාමි—සුරාචමෙරයංච මජ්ජංච පමාදට්ඨානංච සුරාමෙරය මජ්ජපමාදට්ඨානං මජ්ජතීති මජ්ජං මදස්ස භාවො මජ්ජංපමාදස්සඨානං පමාදට්ඨානං තස්මා සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණීසික්ඛාපදං අහං සමාදියාමි—නකාලො විකාලො අකාලෙභොජනං විකාලභොජනං තස්මි අකාලෙ භොජනමෙතස්සාති විකාලභොජනං තස්මා විකාලභොජනා වෙරමණීසික්ඛාපදං අහං සමාදියාමි—නච්චංච ගීතංච වාදිතංච විසූකංච දස්සනංච මාලාච ගන්ධාච විලෙපනංච ධාරණංච මංඩනංච විභූසනංච ඨානංච—නච්ච ගීත වාදිත විසූකදස්සන මාලාගන්ධ විලෙපන ධාරණ මංඩන විභූසනට්ඨානං—නච්චන්තීති නච්චංගීයතීති ගීතං වාදීයතීති වාදිතං විසූකෙනපුතෙතා විසූකං විසූකස්සභාවො විසූකං දස්සනත්ති දස්සනං මාලන්තීති මාලාසූචතීති ගන්ධා විලෙපනත්ති විලෙපනං ධාරෙන්තීති ධාරණං මංඩනන්ති මංඩනං විභූසනන්ති විභූසනං තස්මා නච්චගීත වාදිත විසූකදස්සන මාලාගන්ධ විලෙපන ධාරණ මංඩන විභූසනට්ඨානා වෙරමණී සික්ඛාපදං අහං සමාදියාමි—උච්චංච තං සයනං චාති උච්චාසයනං තමහා උච්චාසයනාච මහන්තංච තං සයනංචාති මහාසයනං තමහා මහාසයනාච වෙරමණීසික්ඛාපදං අහං සමාදියාමි—නඛණ්ඩං අඛණ්ඩං නස්සි ඛණ්ඩං තෙසන්ති අඛණ්ඩංතානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානීති එතෙසු තීසු පදෙසු විග්ගහො එසෙවනයො—භුජිස්සසීලං එතස්ස අත්ථීති භුජිස්සං තානි සීලානි භුජිස්සානි—තං සීලං විඤ්ඤූහි පසත්ථොති විඤ්ඤුප්පසත්ථෝතානි විඤ්ඤුප්පසත්ථානි නස්සි පරෙහි ආමට්ඨොති අපරාමට්ඨො නපරාමට්ඨං අපරාමට්ඨං තානි අපරාමට්ඨානි—සමාධි සංවත්තනිකං තං සීලං එතස්මිං විජ්ජන්තීතිවා සමාධි සංවත්තනිකං තානි සමාධිසංවත්තනිකානි—තවද මේ සීලපරිච්ඡේදයෙහි පබ්බජ්ජා සීලය මදක් දක්වමහ—කෙසේදයත්? “අනුජානාමි භික්ඛවෙ ඉමෙහි තීහි සරණාගමනෙහි පබ්බජ්ජං උපසම්පදන්ති එවංච පන භික්ඛවෙ පබ්බාජෙතබ්බො උපසම්පාදෙ තබ්බො පඨමං කෙසමස්සුං ඔහාරෙත්වා උත්තරාසංගං එකංසං කාරෙත්වා උක්කුටිකං නිසීදාපෙත්වා අඤ්ජලිං පග්ගණ්හාපෙත්වා භික්ඛූනං පාදෙවන්දාපෙත්වා යාචෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා එවංවදෙහීති වත්තබ්බො; බුද්ධංසරණංගච්ඡාමි, ධම්මංසරණංගච්ඡාමි, සංඝංසරණංගච්ඡාමි, දුතියම්පි තතියම්පි ඉමිනා මග්ගෙන සබ්බෙව දෙවමනුස්සා උපාසකභාවෙනවා පබ්බජිත භාවෙනවා සාසනං ඔතරන්ති” යනු වදාළබැවින් පළමුකොට කරගෙඩිදී “කෙසා ලොමා නඛා දන්තා තචො තචො දන්තා නඛා ලොමා කෙසා” යනමේ තච, පංචකය කියවා ඉසකෙස් හා රැවිල බා ශරීර රජස් පහකරවා වස්ත්‍රනිවෙසනය හා උත්‍රසාටකයක් එකාංසකරවා

භික්ෂූන්ගේ පාවදවා පබ්බජ්ජා වාක්‍ය මෙසේ කියවියයුතුය— "ඔකාස කාරුඤ්ඤං කත්වා පබ්බජ්ජං දෙථ මෙ භන්තෙ දුතියම්පි අහං භන්තෙ පබ්බජ්ජං යාචාමි තතියම්පි අහං භන්තෙ පබ්බජ්ජං යාචාමි සබ්බදුක්ඛ නිස්සරණ නිබ්බාණ සච්ඡිකරණත්ථාය ඉමං කාසාවං ගහෙත්වා පබ්බාජෙථ මං භන්තෙ අනුකම්පං උපාදාය—දුතියම්පි අහං....පෙ....දාය—තතියම්පි අහං....පෙ....දාය....සබ්බදුක්ඛ නිස්සරණ නිබ්බාණ සච්ඡිකරණත්ථාය එතං කාසාවං දත්වා පබ්බාජෙථ මං භන්තෙ අනුකම්පං උපාදාය—දුතියම්පි සබ්බදු....පෙ....දාය—තතියම්පි සබ්බදු....පෙ....දාය—ඔකාස අහං භන්තෙ තිසරණෙන සද්ධිං පබ්බජ්ජා දසසීලං යාචාමි කාරුඤ්ඤං කත්වා තිසරණෙන සද්ධිං පබ්බජ්ජා දසසීලං දෙථ මෙ භන්තෙ—දුතියම්පි අහං භන්තෙ තිසරණෙන සද්ධිං පබ්බජ්ජා දසසීලං යාචාමි, කාරුඤ්ඤං කත්වා පබ්බජ්ජා දසසීලං දෙථ මෙ භන්තෙ—තතියම්පි අහං භන්තෙ තිසරණෙන සද්ධිං පබ්බජ්ජා දසසීලං යාචාමි, කාරුඤ්ඤං කත්වා පබ්බජ්ජා දසසීලං දෙථ මෙ භන්තෙ—බුද්ධං සරණං ගච්ඡාමි; ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි, දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි, දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි; දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි, තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි, තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි, තතියම්පි සංඝං සරණං ගච්ඡාමි,—බුද්ධම් සරණම් ගච්ඡාමි, ධම්මම් සරණම් ගච්ඡාමි, සඞ්ඝම් සරණම් ගච්ඡාමි, දුති....පෙ....ගච්ඡාමි—තති....පෙ....පාණාතිපාතා වෙරමණී සික්ඛාපදං සමාදියාමි ....පෙ....ජාතරූප රජත පටිග්ගහණා වෙරමණී සික්ඛාපදං සමාදියාමි—ඔකාස වන්දාමි භන්තෙ සබ්බං අපරාධං ඛමතු මෙ භන්තෙ මයා කතං පුඤ්ඤං සාමිනා අනුමොදිතබ්බං සාමිනා කතං පුඤ්ඤං මය්හං දාතබ්බං සාධු සාධු අනුමොදාමි.

තවද ශ්‍රී ජිනෙන්ද්‍ර ශාසනයාගේ චිරස්ථිතිය සඳහා නියමකර වදාරණ ලද සරණාගමන උපසම්පදාව ආදී අටවැදෑරුම්වූ උපසම්පදා සීලයාගේ පිහිටීම මූලාධාරබැවින් යම් උපසම්පදාවක් පංචසම්පත්ති අනුව ඇති කල්හි පිහිටීම වන්නීද එ පංචසම්පත්තිහු මෙහිදක්වනුලැබේ—පංචසම්පත්ති නාම—වත්ථුසම්පත්ති, ඤත්තිසම්පත්ති, අනුසාවණසම්පත්ති, සීමාසම්පත්ති, පරිසසම්පත්ති—වස්තුසම්පත්තියනම් උපසම්පදාපෙක්ෂකයා හා අෂ්ටපරිෂ්කාරයයි—ඤත්තිසම්පත්තියනම් එසාඤත්ති යනාදි ඤත්ති චතුත්ථ කර්මයයි—අනුසාවණ සම්පත්තියනම් කර්මවාක්‍යානුශ්‍රාවනයයි—සීමාසම්පත්තියනම් විවිධ සීමාසම්පත්තියයි, බද්ධ සීමාව උදකුක්ඛෙප සීමාවයි—පරිස සම්පත්තියනම් කර්මසිද්ධියට හේතු උපසම්පදා අනුදත් ශ්‍රමණ පිරිසයි—එතාසු පංචසම්පත්තීසු එකාසම්පත්ති ඌනාසා උපසම්පදා උදකුක්ඛෙපෙවා බද්ධසීමායවා කතාපි න පතිට්ඨාති කම්මං කුප්පති—උදකුක්ඛෙපො ච බද්ධසීමාච

සන්තාසඞ්ඛාරෙසාන පතිට්ඨතීති වෙදිතබ්බා—සාඉමස්මිං ලංකාදීපේ අතිරෙක දසවග්ගෙහි භික්ඛූහි ඉච්ඡිතං සම්පජ්ජතීති ඤාතබ්බා.

අයංපතිට්ඨා ධරණීව පාණිනං
ඉදංච මූලං කුසලාභිවුද්ධියා
මුඛං චිදං සබ්බ ජිනානුසාසනෙ
යො සීලක්ඛන්ධො වරපාතිමොක්ඛියො.

අයං, මැනොමි; පාණිනං, සත්නට; ධරණීඉව, මෙදිනියමෙන්; පතිට්ඨා, ප්‍රතිෂ්ඨාය; ඉදං, මේ සීලය; කුසලාභිවුද්ධියා, පුන්‍යාභිවෘද්ධියට; මූලං, මුල්වේ; වරපාතිමොක්ඛියො, උත්තමප්‍රාතිමොක්ෂසංඛ්‍යාත; ඉදං යො සීලක්ඛන්ධො, යම් මේ සිල්රැසක්ඇද්ද ඒසීලය තෙම; සබ්බ ජිනානුසාසනෙ, සියලු ජිනශාසනයෙහි; මුඛං, ප්‍රධානවන්නේය. “සාපතිට්ඨතීති පතිට්ඨා ධරතීති ධරණී සාධරණීඉවපාණීනං පතිට්ඨති විරූළ්හභාවං ගච්ඡන්ති මූලං සිඤ්චති පාපසඞ්ඛාත කිලෙසෙ ලුනාතීති කුසලං, කුසලංච අභිවුද්ධිච කුසලාභිවුද්ධි, වඩ්ඪතීතිවුද්ධි, අජිනි ජිනති ජිනිස්සතීති ජිනො, අනුසාසතීති අනුසාසනං, සීලමෙවඛන්ධොති සීලක්ඛන්ධො, වරීයතී පත්ථියතීති වරො, පාලෙතීති පාති—මුංචතීති මොක්ඛි සාපාතිමොක්ඛි.

නවකොටි සහස්සානි අසීතිං සතකොටියො
පඤ්ඤාස සතසහස්සානි ඡත්තිංසාච පුනාපරෙ.
එතෙසංවර විනයා සම්බුද්ධෙන පකාසිතා
පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා සික්ඛාවිනය සංවරාති.

නවකොටිසහස්සානි, නවකෙළදහස්, සතඅසීතිංකොටියො, එක්සිය අසූකෙළ, පඤ්ඤාසසතසහස්සානි, පනස්ලක්ෂ; ඡත්තිංසාච, සතිස්සංවරයොද; සම්බුද්ධෙන, සර්වඥයන්වහන්සේ විසින්; පකාසිතා, වදාරණ ලද්දූහ; විනයසංවරාසික්ඛා, විනයසංවරසික්ෂාවො; පෙය්‍යාලමුඛෙන, පෙය්‍යාලමුඛයෙන්; නිද්දිට්ඨා, දක්වනලද්දූහ.— “නවොච කොටිච සහස්සංච නවකොටිසහස්සානි, අසීතිංච සතංච කොටිච අසීතිංසතකොටියො, පඤ්ඤාසාච සතසහස්සංච පඤ්ඤාසසත සහස්සානි, ඡ චතිංසාච ඡත්තිංසා පුනච අපරොච පුනාපරෙ එසොච සංවරොච විනයොච එතෙසංවරවිනයා සම්මාබුජ්ඣතීති සම්බුද්ධො තෙන සම්බුද්ධෙන පකාසියතීති පකාසිතො, එතෙසංවරවිනයා පකාසිතා, පෙය්‍යාලංච මුඛංච, පෙය්‍යාලමුඛං, තෙන පෙය්‍යාලමුඛෙන, සික්ඛාච විනයොච සංවරොච, සික්ඛාවිනයසංවරො; සික්ඛතීති සික්ඛාවිනෙතීති සික්ඛයතීති විනයො; සංවරීයතීති සංවරො; නිද්දිසීයතීති නිද්දිට්ඨං; එතෙ විනයා නිද්දිට්ඨානි:

මහාවග්ගො චූලවග්ගො පාචිත්තිපාරාජිකො
පරිවාරොතිමෙපංච විනෙපිටකනාති දෙසිතො.

ඉධසීල පභෙදෙ වුච්චතෙ—කුසලං සීලං අකුසලං සීලං අව්‍යාකතසීලං සුඛසීලං දුක්ඛසීලං මණ්ඩනසීලං ආභිසමාචාරිකසීලං ආදිබ්‍රහ්මචරියකාසීලං විරතිසීලං අවිරතිසීලං නිස්සිතසීලං අනිස්සිතසීලං කාලපරියන්තසීලං ආපාණකොටිකසීලං සපරියන්තසීලං අපරියන්තසීලං ලොකියසීලං ලොකුත්තරසීලං හීනසීලං මජ්ඣිමසීලං පනීතසීලං අත්තාධිපතෙය්‍යසීලං ලොකාධිපතෙය්‍යසීලං ධම්මාධිපතෙය්‍යසීලං පරාමට්ඨසීලං අපරාමට්ඨසීලං පටිප්පස්සද්ධිසීලං විසුද්ධසීලං අවිසුද්ධසීලං වෙමතිකසීලං සෙඛසීලං අසෙඛසීලං භික්ඛුසීලං භික්ඛුණීසීලං ගහට්ඨසීලං පබ්බජ්ජාසීලං පකතිසීලං ආචාරසීලං පාතිමොක්ඛසංවරසීලං ඉන්ද්‍රියසංවරසීලං ආජීවපාරිසුද්ධිසීලං පච්චයසන්නිස්සිතසීලන්ති එතෙසු සීලෙසු විත්ථාරො විසුද්ධිමග්ගෙ වුත්තනයෙන ඝදුහාතබ්බා—පංචිමෙ ගහපතයො ආනිසංසා සීලවතො සීලසම්පදාය කතමෙ පංච ඉධ ගහපතයො සීලවා සීලසම්පන්නො අප්පමාදාධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති අයං පඨමො ආනිසංසො සීලවතො සීලසම්පදාය පුනචපරං ගහපතයො සීලවතො සීලසම්පන්නස්ස කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති අයං දුතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නො යං යදෙව පරිසං උපසංකමති යදිඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං විසාරදො උපසංකමති අමඞ්කුභූතො අයං තතියො ආනිසංසො සීලවතො සීලසම්පදාය පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නො අසම්මූළ්හො කාලංකරොති අයං චතුත්ථො ආනිසංසො සීලවතො සීලසම්පදාය පුනචපරං ගහපතයො සීලවා සීලසම්පන්නො කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගංලොකං උප්පජ්ජති අයං පංචමො ආනිසංසො සීලවතො සීලසම්පදායාති.

සග්ගාරොහණ සොපානං අඤ්ඤං සීල සමංකුතො
ද්වාරංවාපන නිබ්බාණ නගරස්ස පවෙසනෙති.

සග්ගාරොහණ, දෙව්ලොවට නැඟීමට; සීලසමං, සීලය සමානවූ; අඤ්ඤංසොපානං, අනික් හිනක්; කුතො, කොයින්ද; නිබ්බාණනගරස්ස, නිර්වාණනාමැති නුවරට, පවෙසනෙපන, ඇතුල්වීමට වනාහී ද්වාරංවා දොරකඩකින් මේ සාසනසුද්ධිදීපනියෙහි තුන්වෙනි සීලපරිච්ඡෙදය නිමි.

සීලපරිච්ඡෙදයයි.

නත්ථිඣානං අපඤ්ඤස්ස පඤ්ඤා නත්ථි අඣායතො
යම්හිඣානංච පඤ්ඤාච සවෙ නිබ්බාණ සන්තිකෙහි.

යනුහෙයින් ධ්‍යානභාවනා පැවැත්වීම ප්‍රඥව නැත්තාහට කැළම නැත්තේය, භාවනාවක් නැත්තාහට ප්‍රඥවකුත් නැත, යමෙක්හට ධ්‍යාන භාවනා දෙකම ඇත්තේද ඒ පුද්ගලතෙම එකාන්තයෙන් නිර්වාණාවබෝධය කරන්නේයයි වදාළහෙයින් මෙහි හය වැදෑරුම්වූ චරිත පුද්ගලයොද ඊට අනුරූප භාවනාද දක්වනු ලැබේ—රාගචරිතො, දොසචරිතො, මොහචරිතො, විතක්කචරිතො, සද්ධාචරිතො, බුද්ධිචරිතොති මෙ ඡ චරිතපුග්ගලා භගවතා වුත්තා—
ඒ රාගචරිතයාගේ ස්වභාවනම් මනාවූ ඇඳීම් පැළඳීම් කැමතිබවද, විසිතුරු ඇතිරිලි අතුරණලද ආසනවල සැතපීමට හා ඉඳීමට කැමති බවද, මධුරාහාර අනුභවයට ප්‍රියබවද, මනොඥවූ නාටසුතුද, බහුල කාමසෙවනාදියද ඇත්තේයයි දතයුතු—එරාග චරිතයාහට අනු දනපාලද භාවනානම් "උද්ධුමාතකං විනීලකං විපුබ්බකං විච්ඡිද්දකං වික්ඛායිතකං වික්ඛිත්තකං හතවික්ඛිත්තකං ලොහිතකං පුළවකං අට්ඨිකං කායානුපස්සනා සතිපට්ඨානං"—මෙකී දසඅසුභයහා කායානුපස්සනා සතිපට්ඨානයයි දතයුතු. ඒ දස අසුභයොද අමුසොහොනේ මිනීසුණු බලමින් භාවනාකරණු ලැබේ—කායානුපස්සනා සතිපට්ඨානය ආරණ්‍ය වෘක්ෂමූල ශූන්‍යාගාරාදියෙහි භාවනා කටයුතු කෙනය—ද්වෙෂචරිතයාගේ ස්වභාවනම්; ගමනාගමනයෙහි පසඟින් මගසාරන්නෙකුමෙන්යයි වහා පය නගයි වහා පය තබයි පදලකුණු පලඳුවෙයි ආහාරානුභවයෙහි තද ආහාර අනුභවයට රුචිවෙයි අහර කිසද පැහැදිලි නොවෙයි නිද්‍රාවෙහි හස්තපාද නික්ෂෙපකොට හුස්ම වැටෙනුවිමෙන් නිදයි බහුලවූ රළුබස්ඇත්තෝයයි දතයුතු—"දොසචරිතස්ස චත්තාරො බ්‍රහ්මවිහාරා චත්තාරිවණ්ණ කසිණානි මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා නීලකසිණං පීතකසිණං ලොහිතකසිණං ඔදාතකසිණං"යනුහෙයින් ද්වෙෂ චරිතයා හට චතුර්විධ බ්‍රහ්මවිහරණයද වර්ණකසිණ හතර හා මෛත්‍රී භාවනාවද කරුණාභාවනාවද මුදිතාභාවනාවද උපෙක්ෂාභාවනාවද යන මේ භාවනා හය ද්වෙෂ චරිතයාට චරිතානුකූල වන්නේය—මොහ චරිතයාගේ සහ විතර්කචරිතයාගේ ලීලාව මෙහි මඳක් දක්වමි; ආහාරානුභවයෙහි අනියත රුචි ඇත්තාහ අනුභවකරණකල්හි අසම්පූර්ණ පිඩු සහිත භොජනය විසුරුවමින් අප්‍රමාන මුඛ විවෘතිනයඇතිව විෂම්පතසිතින් විතර්ක සහිතව අනුභව කෙරෙත්—නිද්‍රාවද වික්ඛිත්ත අත්පාඇතිව නිදන් පුබ්බිඥින කල්හි හුං යන අනුකරණයෙන් ප්‍රමාදව නැගිටිත්—"මොහචරිතස්ස විතක්කචරිතස්ස ආනාපානසති" යනු වදාළබැවින් මොහචරිතයාටද විතර්කචරිතයාටද යන දෙදෙනාටම සතිඝ

වණ්ණනයෙහි වදාළ ආනාපාන කම්මට්ඨාන චරිතානුකූල වන්නේමැයි— සද්ධාචරිතයාගේ ආකාරය රාගචරිතයාට ඇති ස්වභාවයයි දතයුතු. “සද්ධාචරිතස්සපුරිමා ඡානුස්සතියො” යනු වදාළහෙයින් ශ්‍රද්ධාචරිතයාහට සොවාන්ඵලය ආදීලොකොත්තර මාර්ගාධිගමයසඳහා වදාළ බුද්ධානුස්සෘතිය ධම්ම සංඝ සීලචාග දෙවතානුස්සෘතිය අවසන්කොට බුද්ධානුස්සෘතිය ආදී අනුස්සෘතිය භාවනාවට චරිතානුකූලබව වදාළ සේක.—තවද බුද්ධිචරිතයාගේ ස්වභාව රාගචරිත සද්ධාචරිත දෙදෙනාට කීනයින් දතයුතු—“බුද්ධිචරිතස්ස මරණස්සති උපසමානුස්සති චතුධාතුවවත්ථානං ආහාරෙ පටිකූලසඤ්ඤා චත්තාරිසෙස කසිණානි චත්තාරොච පන ආරුප්පා සබ්බචරිතානං අනුකූලානි අනුකූලතො විනිච්ඡයො දට්ඨබ්බො”—බුද්ධිචරිතයාට මරණානුස්සෘති භාවනාවද, උපසමානුස්සති භාවනාවද, පඨවිධාත්වාදී සිව්වැදෑරුම් ධාතුව්‍යවස්ථා භාවනාවද, ආහාරයෙහි පිළිකුල් සංඥා භාවනාවද, අභිරික්තවූ චතුර්විධ කසිණමණ්ඩල භාවනාවද, සතර අරූපාවචරසමවත් සතරහා රූපාවචර සමාපත්ති හතරද යන අෂ්ටසමාපත්තියෙන් යුක්තවූ ධ්‍යානභාවනාවද, යන මේ භාවනාවෝ බුද්ධිචරිතයාට අනුදැනවදාළ චරිතානුකූල භාවනාවෝයයි දතයුතු—මෙසේ දක්වනලද භාවනාවෝ හෙතුකොටගෙණ සියලු මෙතෙජනයො චරිතලෙස භාවනාකිරීමෙන් අමාමහ නිවන්දක්නාහුයයි නුවණින් දැන සියලු කුසල් අතුරෙන් භාවනා කුසලය උතුන්බැවින් කෙලෙස් නසා නිර්වාණය ප්‍රත්‍යක්ෂකිරීමපිණිස එව චරිත භාවනාගෙණ භාවනා කටයුතුකොහය.

රාගොදොසොච මොහොච බුද්ධෙනාදිච්චබන්ධුනා
විතක්කො සද්ධාචරිතො බුද්ධිචරිතොච ඊරිතො

මේ ශාසනසුද්ධිදීපනියෙහි සතරවෙනි භාවනාපරිච්ඡෙදය නිමි.

භාවනා පරිච්ඡෙදයයි.

---

තවද මෙහි පස්වැනිවූ දුස්සීලදෑන විභාගය දක්වම්හ.

කෙසේදයත්?

“දුස්සීලොති නාමං දුස්සීලස්ස කිමත්ථම්දමුච්චතෙ; නිස්සීලත්තාච දුස්සීලොතිවුච්චතෙ භින්නසීලො අසීලොති කෙදයො; එත්ථපභෙදතො පන ගිහිසීලාවිරත්තා ගිහිදුස්සීලො නාම පබ්බජ්ජාසීලා විරත්තා සමණදුස්සීලො නාම ජනෙසු බහුජ්ජනා දුල්ලොපාදුච්චරිතා ළෙහාපාතී තෙනවුත්තං භගවතා.”

අහං නාගොව සංගාමෙ චාපාතොහි ඛිතංසරං
අතිවාක්‍යං තිතික්ඛිස්සං දුස්සීලොහි බහුජ්ජනො.

යනුහෙයින් දුස්සීලවීමෙන් පාරාජිකා ඇතිතාහ; එ දුස්සීලජනයා පිළිබඳ පාරාජිකාප්‍රභෙද වසයෙන් කෙසේවීදයත්? ගිහිජනයා සම්බන්ධවූ සීලභෙදයෙන්ද ගිහිසීලවනානයා පාරාජිකාවන්නේය දුස්සීල වන්නේය, එ ගිහිජනයා පිළිබඳ පාරාජිකා සඞ්ඛ්‍යාව මෙසෙයින් දතයුතු—මාතෘඝාතය, පිතෘඝාතය, අරහන්තඝාතය, ලොහිතුප්පාදය යන ආනන්තරිය කර්ම පනෙන් සංඝභෙදය හැර පාරාජිකා හතර සහ ගිහිසීලභෙදයෙන් වන පාරාජිකාවන් සමග ගිහිපාරාජිකා පනන් විද්‍යමානබව දතයුතු—එ ගිහිපාරාජිකාහෙතුවෙන්ද සංජීවාදි නරකවලද තිරිසන් අපායෙහිද ප්‍රෙතනිකායෙහිද අසුරනිකායෙහිද ඉපද මහත් දුක්විඳිම වන්නේය; එසේහෙයින් ගිහිදුස්සීලය හැර ගිහිසීලවනානාව නොයෙක් පින්රැස්කිරීමෙන් සගමොක්සැප අත්පත් කටයුතු—තවද මජ්ඣිම නෙවටවාදී ගිහිදුස්සීලයන්ටත් දන්දීමෙන්ද ආනිසංස වන්නේමැයි—තදාහි—"දානංනාම කෙනචි විනිවාරිතං යාචකස්ස සතිසම්භාවෙ දාතබ්බං—දානයනම් කිසි තුවු නැත්තෙක් විසින් නොවලක්කන ලද; යාචකයක්හුගේ එළඹීම ඇති වනකල්හි දන්දියයුතුයෙතය—මෙසෙයින් ගිහිදුස්සීල දානයක් ඇති බවද දතයුතු.

දූතිමච්ඡං කුසග්ගෙන යො නරො උපනය්හති
කුසාපි පූතිවායන්ති එවං බාලූපසෙවනං
බාලං නපස්සෙ නසුණෙ නච බාලෙ න සංවසෙ,
බාලෙන අල්ලාපසල්ලාපං නාකරෙ නච රොචයෙ.
නභජෙ පාපකෙ මිත්තෙ නභජෙ පුරිසාධමෙ
භජෙථ මිත්තෙ කල්‍යාණෙ භජෙථපුරිසුත්තමෙ,

යනුහෙයින් ගිහිදුස්සීලයා පවා සෙවන භජන පයුරුපාසනාය තානනම්කර වදාළ හෙයින් ගිහි පාපයාද පවිටුබැවින් ඔහුගේද දිෂ්ටි සංඛ්‍යාත සවභායෙහි පිහිටියේවිනම් කයබුන් මරණින් මතු අපායෙහි උපදින බව දැන ඒ ලාමක ලීලාවේ නොපිහිටා තෙමේ වෙතට පැමිණීම ඇතිකල්හී දන්දීමෙන් සත්කාරකටයුතුයෙතය—තවද පැවිදි තෙමේ පාරාජිකාවීමෙන් දුස්සීලවන්නේය; එ ශ්‍රමණ දුස්සීලයෝද දෙවැදෑරුම් වෙති, එ දෙයාකාර ශ්‍රමණදුස්සීලයෝ කව්රුදයත්? ප්‍රතිච්ඡන්න කුහනලපනාදියෙන් යුක්තවූ ප්‍රකට නොවන්නාවූ කට යුතු ඇති ප්‍රියසිලි භික්ෂූන්වහන්සේලා සමග පාමොක් දෙසීමාදී ගුණ දහයට ඇතුලත්වූ කටයුතු පවත්වන්නාවූ සභචාරී සංඝයා හා දායකයො නොදන්නාවූ පටිච්ඡන්න දුස්සීලයාද පාමොක් දෙසීමාදී

කාවයුතුවලින් හා සංඝයාගෙන්ද දායක උපස්ථානයෙන්ද පහවූ ප්‍රකට ශ්‍රමණ දුස්සීලයාද යන දෙදෙනා බව දතමැනව්—තවද ඒ ශ්‍රමණ දුස්සීලයාපිළිබඳ නොතු පාරාජිකා මෙසේ දතයුතු.

"අදින්නාදානංච මෙථුන ධම්මො මනුස්සවිග්ගහොච උත්තරිමනුස්සධම්මො පරාජිකාච එතෙ චත්තාරොච වුත්තා" අදින්නාදානපාරාජිකාවද, මෛථුන ධම්ම පාරාජිකාවද මනුෂ්‍යවිග්‍රහ පාරාජිකාවද, උත්තරිමනුස්සධම්ම පාරාජිකාවද, යන හතර දෙසනාකරණ ලද්දුහ.

මුදුපිට්ඨිච ලම්බීච මුඛගාහ නිසීදකො
පාරාජිකා ඉමෙ තෙසං චත්තාරො අනුලොමිකා.

"ආදියතීති ආදානං නදත්තො අදත්තො තං අදත්තං අදත්තස්ස වත්ථුස්ස ආදානං අදින්නාදානං අදින්නාදානංච පාරාජිකොච අදින්නාදානපාරාජිකො අදින්නාදාන පාරාජිකො එතස්මිං විජ්ජතීති අදින්නාදානපාරාජිකො පරාජයතීති පාරාජිකො—මෙථුන චෙව ධම්මො මෙථුනධම්මො මිථුනානං මෙථුනං මෙථුනධම්ම පාරාජිකො යස්මිං භික්ඛුස්මිං විජ්ජතීති සො මෙථුනධම්ම පාරාජිකො—මනුස්සස්සවිග්ගහො මනුස්සවිග්ගහො මනුස්සවිග්ගහපාරාජිකො යස්මිං විජ්ජතීති මනුස්සවිග්ගහපාරාජිකො එතං මනුස්සවිග්ගහානොති මනුස්ස මාරණස්සෙතං අධිවචනං—උත්තරොච සො මනුස්සොචෙති උත්තරිමනුස්සො උත්තරිමනුස්සධම්මපාරාජිකො ඉමස්මිං විජ්ජතීති සො උත්තරිමනුස්සධම්මපාරාජිකො යො උත්තරි මනුස්සධම්මං පාරාජිකං පත්තොච සො උත්තරිමනුස්සධම්මපාරාජිකො හොති උත්තරිමනුස්සධම්මා පාරාජිකො එතස්ස අත්ථීති සො උත්තරිමනුස්සධම්ම පාරාජිකො—මුදුකාපිට්ඨි එතස්සෙති මුදුපිට්ඨිකො ලම්බං අඞ්ගජාත මෙතස්සෙති ලම්බී පරස්ස නිමිත්තං මුඛෙනගණ්හං මුඛගාහො අත්තනො අඞ්ගජාතං පරස්ස උච්චාරමග්ගෙ පවෙසනං උද්ධං පරස්ස අඞ්ගජාතං අත්තනො උච්චාරමග්ගෙ නිසීදනං එතස්ස අත්ථීති නිසීදකො"—යනාදීන් දක්වනලද ඒඒ පාරාජිකාවන්ට පැමිණීම ඇතිනාවූ එබඳු ශ්‍රමණ දුස්සීලයා ආශ්‍රයකරණ තැනැත්තා ඒ දුෂ්ටියට පැමිණීම හෙතුකොට ගෙණ දුර්ගතිගාමිණී වනබැවින් එනිස්සීලයා සෙවනය නොකට යුතු බව අංගොත්තරසඟියෙහි තිකනිපාතෙ ජිගුච්ඡසූත්‍රයෙහි මෙසේ වදාළසේක—"තයොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තොසං විජ්ජමානා ලොකස්මිං කතමෙ තයො අත්ථි භික්ඛවෙ පුග්ගලො ජිගුච්ඡිතබ්බො නසෙවිතබ්බො නභජිතබ්බො නපයිරුපාසිතබ්බො...පෙ...ඉමෙඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තොසං විජ්ජමානා ලොකස්මින්ති... තවද අඞ්ගීරසගුණොපෙත අලාමක ලක්ෂණගති ඇති සම්බුද්ධයන්

වනාන්සේවිසින් ජිගුච්ඡසූත්‍රදේශනාවේ දුස්සීලයා ආශ්‍රය නොකටයු
තුය පිළිකුල් කටයුතුය ආලය නොකටයුතුය නැවත නැවතද
පයුරුපාසනය නොකළයුතුයයි වදාරණලද බැවින්ද—

යාදිසං කුරුතෙ මිත්තං යාදිසං උපසෙවති
සවෙ තාදිසකො හොති සහවාසොපි තාදිසො.

යාදිසං, යම්බඳුකෙණෙක්; මිත්තං කුරුතෙ, මිත්‍රකෙරේද; යාදිසං,
සම්බඳුගුණැත්තෙක්; උපසෙවති, ආශ්‍රයකෙරේද; සවෙ, එකාන්ත
යෙන්; සො, හේතෙමේ; තාදිසකො හොති, එබඳුගුණයුක්තතෙක්වේ;
සහවාසොපි, සමඟවාසයද තාදිසො, එබඳුවේ; වදාළබැවිනුදු—"ඡසත්ථා
රෙ සෙවන්තානං මිච්ඡාදිට්ඨිකානංවිය දෙවදත්ත සෙවන්තානං කො
කාලිකාදීනං විය දුස්සීල සෙවනං දීඝරත්තං අහිතාය දුක්ඛාය
හොති ඡසත්ථාරෙ" බුද්ධශාසනෙන් පිට පූර්ණකාශ්‍යපාදී ශාස්තෘවර
යන් සයදෙන; සෙවන්තානං, සෙවනයකළාවූ; මිච්ඡාදිට්ඨිකානංවිය,
මිථ්‍යාදෘෂ්ටිකයන්ට මෙන්ද; දෙවදත්ත සෙවන්තානං, බුදුහස්නේ පැවි
දිවූ දෙව්දත් තෙර ආශ්‍රයකළාවූ; කොකාලිකාදීනං විය, කොකාලිකයා
ආදී දෙවදත්ත ශ්‍රාවකයන්ටමෙන්ද; දුස්සීලසෙවනං, ගිහිදුස්සීලයා
ගේද ශ්‍රමණදුස්සීලයාගේද සෙවනය; දීඝරත්තං, බොහෝකලකට;
අහිතාය දුක්ඛාය හොති, අවැඩපිණිස දුක්පිණිසවන්නේය—"සෙය්‍ය
ථාපි ඡවාලාතං උභතොපදිත්තං මජ්ඣෙ ගූථගතං නෙවගාමෙ කට්ඨ
ත්ථං ඵරති න අරඤ්ඤෙ තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි"
භික්ඛවෙ, මහණෙනි; සෙය්‍යථාපි, යම්සේ; උභතොපදිත්තං, දෙකො
ණගිනි ඇවිළෙණලද; මජ්ඣෙ ගූථගතං, මැද අසූචිතැවරුණාවූ; ඡවා
ලාතං, සොහොන්පෙනෙල්ල; ගාමෙ, ගමදී; කට්ඨත්ථං, දරපිණිසද;
නෙවඵරති, නොම පලයි; අරඤ්ඤෙ, වනයෙහිදී දඬුපිණිසද; න,
නොම කපයි නොසසී;—භික්ඛවෙ, මහණෙනි; ඉමං පුග්ගලං, මේදුස්සීල
පුද්ගලයා; තථූපමං, එසේ සොහොන්පෙනෙල්ලට උපමාකොට;
වදාමි, වදාරමි යනුවදාළබැවිනුදු—"යථා දීඝවිදස්සභාතා චතුබුද්ධන්තරං
සට්ඨියොජනමත්තෙන අත්තභාවෙන උත්තානො පතිතො මහානි
රයෙ පච්චති තස්සදිට්ඨිං අභිරුචිතානි පංචකුලසතානි තස්සෙව සහ
ව්‍යතං උප්පන්නා මහානිරයෙ පච්චන්ති—යම්සේ දීඝවිදඝීභාත්‍රැවූ
දුස්සීලශ්‍රමණයා චතුබුද්ධන්තරං, බුද්ධාන්තර සතරක්; සට්ඨියොජන
මත්තෙන, හැටයොදුන් පමණ; අත්තභාවෙන, ආත්මභාවයෙන්;
උත්තානො පතිතො, උඩුබැල්ලින්වැටී; මහානිරයෙ පච්චති, අවීචිමහ
නිරයෙහි පැසේ; තස්සදිට්ඨිං, ඔහුගේ දෘෂ්ටානුගතියෙහි; අභිරුචිතානි,
බැඳුනාවූ; පංචකුලසතානි, කුලගෙවල් පන්සියයෙක සත්‍රීපුරුෂයෝ;
තස්සෙවසහව්‍යතං, තමා හා සමග; උප්පන්නා, ඉපද; මහානිරයෙ, අවී
චියෙහි; පච්චන්ති, පැසෙත්; යනු දක්වනලද බැවින්ද—කවද අංගුත්ත

සඟියෙහි වදාළ අප්පසාද සූත්‍රවර්ණනාවෙහි— "අප්පසාදං පවෙදෙය්‍යුන්ති අප්පසන්නභාවං ජානාපෙය්‍යුං අප්පසන්නභාවං ජානාපෙන්තෙන කිං කාතබ්බං නිසින්නාසනතො න වුට්ඨාතබ්බං න දෙය්‍යධම්මො දාතබ්බො අප්පසාදං පවෙදෙය්‍යුං ඉති අප්පසාදං පවෙදෙය්‍යුං" යනු අප්පසන්නභාවං, දුශ්ශීලශ්‍රමණයා කෙරෙහි ප්‍රසන්නනැතිබව; ජානාපෙය්‍යුං, දැන්වියයුත්තාහුය; අප්පසන්නභාවං, අකමැතිබව; ජානාපෙන්තෙන, දන්වන්නාවූ දායකයා විසින්; කිං කාතබ්බං, කුමක්කටයුත්තෙද; නිසින්නාසනතො, දායකයා උන්ආසනයෙන්; න වුට්ඨාතබ්බං, දුශ්ශීලශ්‍රමණයා ලඟට පැමිණිකල්හි නොනැගිටියයුත්තේය; දෙය්‍යධම්මො, දියයුතු සිව්පසදනය; න දාතබ්බො, දුස්සීල ශ්‍රමණයාලඟට නැවත නැවත පැමිණීමෙන් නිතර ඔහු ආශ්‍රයකරමින් නොදියයුත්තේය; ආහරසිඟීමට ගෙදරටපැමිණිකල්හි දියයුත්තේය; යනු වදාළහෙයින්ද— "භගවතා පන අත්තනො සාසනෙ සීලවතො එවපච්චයා අනුඤ්ඤාතා න දුස්සීලස්ස" —භගවතා පන, භගවත්හු විසින් වනාහි; අත්තනොසාසනෙ, තමබුදුසසුනෙහි; සීලවතොඑව, සිල්වත්භික්ෂුවටම; පච්චයා, චීවර පිංඩපාත සෙනාසන ගිලානප්‍රත්‍ය; අනුඤ්ඤාතා, නියමකරණලද්දාහ; දුස්සීලස්ස, දුස්සීල ශ්‍රමණයාට දීම; න, නොවදාරණලද්දාහ.

මෙසේ චීවරාදී සිව්ප්‍රත්‍ය සිල්වත් භික්ෂුවට අනුදන්බැවින් දුස්සීල ශ්‍රමණයාට දීම කෙසේදයත්? "දානංනාම සගුණස්සපි නිග්ගුණස්සපි යස්සකස්සචි දාතබ්බං" —බොධිසත්වචරිතයෙහි මෙසේ දක්වනලදි— දානංනාම, දන්දීම නම්; සගුණස්සපි, ගුණැත්තාවද; නිග්ගුණස්සපි, ගුණනැත්තාවද; යස්සකස්සචි, යම්කිසිවෙක් විසින්; දාතබ්බං, දියයුත්තේය;—යනු වදාළහෙයින් දුස්සීලයාට දන්දීම නම් දායකයාලඟට එළඹුනුකල්හි දීම වන්නේය— "නවොච භික්ඛුහොති දුස්සීලො පාපධම්මො ඉදමස්ස දුබ්බණ්ණතා සෙය්‍යථාපි සො පොත්ථකො දුබ්බණ්ණො තථූපමො අයං පුග්ගලො තස්සබොපන සෙවන්ති භජන්ති පයිරුපාසන්ති දිට්ඨානුගතිං ආපජ්ජන්ති තෙසං තං හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය ඉදමස්ස දුක්ඛසම්ඵස්සතා සෙය්‍යථාපි සො පොත්ථකො දුක්ඛසම්ඵස්සො තථූපමො අයං පුග්ගලො යෙසං බොපන පතිගණ්හාති චීවර පිංඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරානි තෙසං තං හොති න මහප්ඵලං න මහානිසංසං ඉදමස්ස අප්පග්ඝතා සෙය්‍යථාපි සො පොත්ථකො අප්පග්ඝො තථූපමො අයං පුග්ගලො" යනුහෙයින් දුස්සීලයා භණ්ඩවස්ත්‍රයට බඳු උපමාඇත්තේය දුස්සීලයාට ගුණරහිතව දන්දීමෙන්ද ස්වල්ප ආනිසංස වන්නේය එදුස්සීල සේවනයෙන් දුෂ්ටියට බැඳීම හෙතුකොටගෙණ අපාගත වන්නේය— "සොම්නස්ස සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරික

මෙකං සසංඛාරිකමෙකං සොමනස්ස සහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං උපෙක්ඛා සහගතං ඤාණසම්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං උපෙක්ඛාසහගතං ඤාණවිප්පයුත්තං අසංඛාරිකමෙකං සසංඛාරිකමෙකං"—සොමනස්සසහගතං, සතුටුසිතහා එකතුවූ; ඤාණසම්පයුත්තං, නුවණින් දන්දීමෙන් හා සිල්රැකීමෙනි යොදන්නාවූ; අසඞ්ඛාරිකං, තෙමේ පිළිබඳවූ; එකං, එක් කුසල සිතෙක; සසඞ්ඛාරිකං, සෞමනස්‍ය හා එකතුවූ ඤාණසම්ප්‍රයුක්තවූ චිත්තයෙන් අනිකෙක්ලවා දනාදි පින්රැස්කරවීම ඇත්තාවූ; එකං, එක් කුසලසිතෙක; සොමනස්සසහගතං, සෞමනස්‍ය හා එක්වූ; ඤාණවිප්පයුත්තං, නුවණින් වෙන්වූ කුසලසිත යොදන්නාවූ; අසඞ්ඛාරිකං, තෙමේ පිළිබඳවූ; එකං, එක් කුසල සිතෙක; සොමනස්සසහගතං, සතුටුසිත්හා එකතුවූ; ඤාණවිප්පයුත්තං, නුවණින් වෙන්වූ; සසඞ්ඛාරිකං, අනිකෙක් ලවා දනාදී පින්රැස්කරවීම ඇත්තාවූ; එකං, එක් කුසලසිතෙක; උපෙක්ඛාසහගතං, නොසතුටු මැදහත් සිත හා එක්වූ; ඤාණසම්පයුත්තං, නුවණින් දනාදී කුසල්සිත යොදන්නාවූ; අසඞ්ඛාරිකං, තෙමේ පිළිපිබඳවූ; එකං, එක් කුසලසිතෙක; නොසතුටු සිතහා එකතුවූ ඤාණයෙන් යුක්තවූ; සසඞ්ඛාරිකං, අනිකෙක් ලවා දනාදි පින්රැස්කිරීම ඇත්තාවූ; එකං, එක්කුසලසිතෙක; උපෙක්ඛාසහගතං, මැදහත්සිත හා එක්වූ; ඤාණවිප්පයුත්තං, නුවණින් වෙන්වූ දනාදී කුසල්සිත යෙදීම ඇත්තාවූ; අසඞ්ඛාරිකං, තෙමේ ප්‍රතිබද්ධවූ; එකං, එක් කුසලසිතෙක; උපෙක්ඛාසහගතං: නොතුටුසිතහා එක්වූ; ඤාණවිප්පයුත්තං, නුවණින් වෙන්වූ දනාදි කුසල් සිත යොදන්නාවූ; සසඞ්ඛාරිකං, අනිකෙක් ලවා දනාදී පින්රැස්කිරීම ඇත්තාවූ; එකං, එක් කුසලසිතෙකැයි වදාළසේක—"සොමනස්සස්ස සහගතං සොමනස්සසහගතං සොමනස්සෙන සහගතං සොමනස්සසහගතං ඤාණෙන සම්පයුත්තං ඤාණසම්පයුත්තං නත්ථි සඞ්ඛාරචිත්තං එතස්සාති අසඞ්ඛාරං අසඞ්ඛාරචිත්තෙන යුත්තො අසඞ්ඛාරිකං—එකමෙවකං—අත්ථි සසඞ්ඛාරචිත්තං එතස්සාති සසඞ්ඛාරං සසඞ්ඛාරචිත්තෙන යුත්තො සසඞ්ඛාරිකං—ඤාණෙන විප්පයුත්තං ඤාණවිප්පයුත්තං—ඤාණෙන සම්පයුත්තං ඤාණසම්පයුත්තං—උපෙක්ඛාය සහගතං උපෙක්ඛාසහගතං"—තවද අප සර්වඥයන් වහන්සේවිසින් දෙසනාකරණලද විවිධ කුසලින්යුක්තවූ මේ කාමාවචර කුසල්සිත්අට ඤාණයෙන්යුක්තවූ පුරුෂයෙක් යම්සේ විද්‍යමානවූ ජාම්බෝනද උත්තමසුවර්ණය තුලාසඞ්ඛ්‍යාතවූ තරාදියෙන් සඳසකොට කිරීමෙන් බෙදන්නේද එපරිද්දෙන් මේ අසංඛාරිකකුසලසිතය, මේ සසංඛාරික කුසලසිතය යනාදීන් අඩුවැඩිනොව කාමාවචර කුසල්සිත්අට තන්ත්‍රාකාරයෙන් විනෙයජනයන් කෙරෙහි

කාරුණාවෙන් මහාකොට බෙද වදාළසේක—එ කුසල්සිත්අටෙන් උපෙක්ෂාසහගත කුසල්සිත්හතර දානමුඛයෙහි වදාළේ දුස්සීලදානය සඳහායයි දතයුතු—එකුසල චිත්තයෙහි වෙනස කවරේදයත් දුස්සීලයාලඟට නැවනැවත කෙණෙහි කෙණෙහි නිතරනිතර එළඹීමෙන් දන්දීම නොවන්නේය, දායකයාලඟට දුස්සීලයා එළඹුනුකල්හි නොසතුටු සිතින් දීමවන්නේය.

තවද සර්වඥශාසනයෙන් පිට දියයුතු දාන හතරක් ඇත්තාහ; එදාන හතර කවරේද “තිරච්ඡාණගතෙ දානංදත්වා සතගුණා දක්ඛිණා පාටිකංඛිතබ්බා පුථුජ්ජන දුස්සීලෙ දානංදත්වා සහස්සගුණා දක්ඛිණා පාටිකංඛිතබ්බා පුථුජ්ජන සීලවන්තෙ දානංදත්වා සතසහස්සගුණා දක්ඛිණා පාටිකංඛිතබ්බා බාහිරකෙ කාමෙසු වීතරාගෙ දානංදත්වා කොටිසතසහස්සගුණා දක්ඛිණා පාටිකංඛිතබ්බා”—තිරච්ඡාණගතෙ, බලුකපුටු සංඛ්‍යාත තිරිසණෙකුට; දානංදත්වා, දන්දී; සතගුණාදක්ඛිණා, එදක්ෂිණාව සියක්ජාතියෙහි ආයු වර්ණ සැප බල ප්‍රඥ යන ආනිසංස පහන් සමග පන්සීයක් ආනිසංස දෙන්නීයයි; පාටිකංඛිතබ්බා, කැමතිවියයුත්තීය; පුථුජ්ජනදුස්සීලෙ, පුහුදුන් දුස්සීලයෙක් කෙරෙහි; දානංදත්වා, දන්දී; දක්ඛිණා, එදක්ෂිණාතොම; සහස්සගුණා, දහසක්ආනිසංස දහක් ජාතියෙහි ආයු වර්ණ සැප බල ප්‍රඥ යන පහන් සමග පන්දහසක් ආනිසංස; පාටිකංඛිතබ්බා, කැමතිවියයුත්තීය; පුථුජ්ජනසීලවන්තෙ, ගොවුත්ති අජවුත්ති කුක්කුරවුත්තියෙහි පිහිටියාවූ සිල්වතෙක් කෙරෙහි; දානංදත්වා, දන්දී; දක්ඛිණා, එදක්ෂිණාතොම; සතසහස්සගුණා, ලක්ෂයක්ජාතියෙහි; ආයුවර්ණ සැප බල ප්‍රඥ යන ආනිසංස පහන්සමග පස්ලක්ෂයක් ආනිසංස; පාටිකංඛිතබ්බා, කැමතිවියයුත්තීය; බාහිරකෙ, මෙයින්පිටත්; කාමෙසු, පංචකාමාදියෙහි; වීතරාගෙ, පහවූරාගඇති තාපසයෙක් කෙරෙහි; දානංදත්වා, දන්දී; දක්ඛිණා; එදක්ෂිණාතොම; කොටිසතසහස්සගුණා, කෙළලක්ෂයක් ජාතියෙහි ආයු වර්ණ සැප බල ප්‍රඥ යන පහන් සමග පස්කෙළලක්ෂයක් ආනිසංස; පාටිකංඛිතබ්බා, කැමතිවිය යුත්තීයයි වදාළසේක.

මෙහි දක්වනලද දාන හතරෙන් බාහිර තවුස් හට දෙන දානය හැර අනිකුදු දානතුණතෙමේ ගුණේපිහිටා දියයුත්තේය.

යො සීලවා දුස්සීලෙසු දදාතිදානං
ධම්මෙනලද්ධා සුපසන්නචිත්තො
අභිසද්දහං කම්මඵලං උළාරං
සාදක්ඛිණා දායකතො විසුජ්ඣති.

පසන්නචිත්තො, ප්‍රසන්නසිතඇත්තාවූ; උළාරංකම්මඵලං, මහත් කුසලකර්මවිපාකය; අභිසද්දහං, අදහන්නාවූ; යොසීලවා, යම් සිල්

එතෙක්තෙම; ධම්මෙන, දහමින්; ලද්ධා, ලදවස්තුවෙන්; දුස්සීලෙසු; දුස්සීලයන්කෙරෙහි; දානං, දානයක්; දදාති, දේද; සාදක්ඛිනා, එදක්ෂිණාතොමෝ; දායකතො, දායකයාකෙරෙන්; විසුජ්ඣති, පිරිසිදුවන්නීය—තවද මෙහි අදහස කෙසේදයත් සිල්වත් දායකතෙමේ පවිත්‍ර දුස්සීලආශ්‍රය දෙසබව තෙමේ දනනාබැවින්ද ආයජීවිතයෙහි දුස්සීල ආශ්‍රය තහනම් කළහෙයින්ද දුර්ගතියට හයැති බැවින්ද ශ්‍රමණ දුස්සීලයෙක් ලඟට හෝ ගිහිදුස්සීලයෙක් ලඟට හෝ පැමිණි දුස්සීලයන්ට දන්දීමක් නැත්තේය ඊට උදාහරණ අටුවාවේ මෙසේ දක්වනලදි. "යො සීලවා'ති එත්ථ වෙස්සන්තරරාජා කථෙතබ්බො"—යොසීලවා යනු මෙහි වෙස්සන්තරරාජතෙමේ කියයුතුයි, එ වෙස්සන්තර රජ තෙම තමන් ලඟට ආ යාචකයන්ට දන්දීම පැවැත්තූ බවද දතයුත්තේය.

යො දුස්සීලො සීලවන්තෙසු දදාතිදානං
අධම්මෙනලද්ධා අප්පසන්න චිත්තො
අනභිසද්දහං කම්මඵලං උළාරං
සාදක්ඛිණා පටිග්ගාහකතො විසුජ්ඣති

අප්පසන්නචිත්තො, ප්‍රසන්නසිත නැත්තාවූ; උළාරංකම්මඵලං, මහත් කර්මවිපාකය; අනභිසද්දහං නොඅදහන්නාවූ; යො දුස්සීලො, යම් දුස්සීල දායකයෙක්; අධම්මෙන, අධර්මයෙන්; ලද්ධා, ලදවස්තුවෙන්; සීලවන්තෙසු, සිල්වතුන් කෙරෙහි; දානං, දානයක්; දදාති, දේද; සාදක්ඛිණා, එදක්ෂිණාතොම; පටිග්ගාහකතො, ප්‍රතිග්‍රාහකයාගෙන්; විසුජ්ඣති, පිරිසිදුවන්නීය.

යො දුස්සීලො දුස්සීලෙසු දදාතිදානං
අධම්මෙන ලද්ධා අප්පසන්න චිත්තො
අනභිසද්දහං කම්මඵලං උළාරං
සාදක්ඛිණානෙව උභතො විසුජ්ඣති.

අප්පසන්නචිත්තො, අප්‍රසන්නසිතඇත්තාවූ; උළාරං කම්මඵලං, මහත්වූ කර්මවිපාකය; අනභිසද්දහං, නොඅදහන්නාවූ; යොදුස්සීලො, යම්දුස්සීලයෙක්; අධම්මෙන, අධර්මයෙන්; ලද්ධා, ලදින්; දුස්සීලෙසු, දුස්සීලයන් විසයෙහි; දානං, දානයක්, දදාති, දේද; සාදක්ඛිණා, එදක්ෂිණාතොම; උභතො, දෙපක්ෂයෙන්: නෙවවිසුජ්ඣති, නොමපිරිසිදුවන්නීය—දන්දීමට කැමතිසිත නැත්තාවූ දානානිසංස නොසලකන්නාවූ දුස්සීලදායකයෙක් අධර්මවස්තුවෙන් තමන් ලඟට පැමුණුනාවූ දුස්සීලයෙකුට දන්දේද එදානය දායකප්‍රතිග්‍රාහක දෙදෙනාගෙන්ම පිරිසිදුවීමක් නැත්තේය, යමෙක් දුස්සීලයෙකුට දන්දිලා

ඤාතිප්‍රෙතයෙක් දුකින් මුදවන්ට බැරිබව වඩුනනාවේ වැද්දාගේ කථාවෙන් දතයුතු—"නෙව උභතො විසුජ්ඣන්ති එකච්ඡඩසමානවා සිළුද්දකො කාජෙ තමෙබ්බා" යනාදින් වඩුනනාවේ වැදිතෙමේ තමන් ගේ ඤාතිප්‍රෙතයෙක් එදුකින් මුදවනු සඳහා තුන්පිටකම් දුසසිල ශ්‍රමණයෙකුට දන්දුන්නේ විනුමුත් ප්‍රෙතදුකෙන් නොමිදුනේය.

යො සීලවා සීලවන්තෙසු දදාති දානං
ධම්මෙනලද්ධා සුප්පසන්නචිත්තො
අභිසද්දහං කම්මඵලං උළාරං
තංවෙදානං විපුල ඵලන්ති බ්‍රෑමි,

සුප්පසන්නචිත්තො, ඉතාප්‍රසන්නචිත්තය ඇත්තාවූ; උළාරංකම්ම ඵලං, මහත් කුසලකර්ම විපාකය; අභිසද්දහං, අදහන්නාවූ: යොසී ලවා, යම්සිලවන්තයෙක් තෙමෙ; සීලවන්තෙසු, සිල්වතුන්කෙරෙහි; ධම්මෙනලද්ධා, දහමින්ලද වස්තුවෙන්; දානං, දානයක්; දදාති, දේද; වෙ, ඒකාන්තයෙන්; තංදානං, එදානයෙහි ආනිසංසය; විපුලඵලං ඉති, මහත් විපාකයයි; බ්‍රෑමි, දෙසනා කරමි—"භවිස්සන්ති ඛො පනානන්ද අනාගතමද්ධානං ගොත්‍රභුනො කාසාවකණ්ඨා දුස්සීලා පාපධම්මා තෙ දුස්සීලෙසු සංඝං උද්දිස්ස දානං දස්සන්ති තදාපාහං ආ නන්ද සංඝගතං දක්ඛිණං අසංඛෙය්‍යං අප්පමෙය්‍යං වදාමි"–නම්ද ආන න්දය අනාගතයෙහි ශ්‍රමණගොත්‍රයෙහිවූ සතරවැදෑරුම් ආයර්යයන් අතුරෙන් "අරියානං ලිඞ්ගා අරියලිඞ්ගා" යනුහෙයින් ලිංගාර්‍ය්‍යවූ මාර්ගදූෂක දුස්සීලයන්ට ඇතුලත්වූ කාසාවකණ්ඨනාම් ලාමක දුස්සී ලයො මතු පහළවෙති, එදුස්සීලයන් කෙරෙහි ආයර්සංඝයා උදෙසා දන්දෙන්නාහුද; එම්බා ආනන්දය එකල්හි දෙනනාවූ එසාඞ්ගීකදානය ගණනක් නැත්තාවූ ප්‍රමාණයක් නැත්තාවූ ආනිසංස ඇත්තේයයි දෙසනාකරමි—යනුහෙයින් මෙසේ වදාළේ ශාසනය අතුරුදන් විම ට ආසන්නවූ අනාගතකාලයබැවිනි, එසමයෙහි කිසිසේත් සීලවන්ත යන් නැතිහෙයිනි, ඊට උදාහරණ මෙසේ දතයුතු—"අපිච එතරහි සංඝකාසාවකණ්ඨ සංඝෙන සද්ධිං න උපනෙතබ්බා" යනු වදාළ බැවින් මේකාලයෙහි සංඝයා එකාසාවකණ්ඨ දුස්සීලයන්ට එමාර්ග දූෂිකයන්හා සමග ඔවුන්ට සමාන නොකටයුත්තේය "ඉදමුදාහර ණං දාටබ්බො ජාතරූපෙහි සද්ධිං නො පනෙතබ්බා කාඨලාගො" මේ උදාහරණය දතයුතු–සවර්ණහා සමග කැබිලිති සමාන නොකට යුතුය "ජිගුච්ඡිතබ්බා න සෙවිතබ්බා න භජිතබ්බා න පයිරු පාසිතබ්බාති" වදාළහෙයින් එ අනාගතයෙහි කටයුතු මේකාලෙට නොගැලපෙනය—මේ සාසනසුද්ධදීපනියෙහි පස්වෙනි දුස්සීලදාන භාගය කියා නිමවනලදී.

කවද මෙහි සූපටිච්ඡන්න පරිච්ඡේදය කෙසේදයත්?

"පරිමණ්ඩලං නිවාසෙතබ්බං" යනු හෙයින් සම්පූර්ණ චාරිත්‍ර වාරිත්‍ර ඇති අප සර්වඥයන්වහන්සේ විසින් තමන්ට සඟනට අනුකම්පා පිණිස පරිමණ්ඩල නිවෙසනය මෙසේ පනවා වදාරණලද්දේය-පරිමණ්ඩලං, හාත්පස වටකොට; නිවාසෙතබ්බං, ඇඳියුතුතනය; යන දෙසනාපාලියට අට්ඨකථාචාරීන් විසින් සකස්කොට ඇඳීමෙහි විස්තරය අටුවාවේ මෙසේ දක්වනලදී.

ආපාණතෝ හිරුණාභිච්චං කතනබ්බං පරිමණ්ඩලං
ජානුමණ්ඩලතොහෙට්ඨා අට්ඨඞ්ගුල පමාණකං
ඔතාරෙත්වා නිවාසෙතබ්බං තතො ඌනං නවට්ටති.

ආපනාභි, ඇටැත් පැමිණීමෙහි; හිරුණා, හැඟී භික්ෂුව විසින්; නිච්චං, නිතර; පරිමණ්ඩලං, සකස්කොට ඇඳිය; කතබ්බං, කටයුතුතනය; ජානුමණ්ඩලතො, දනමඬලපටන්; හෙට්ඨා, යට; අට්ඨඞ්ගුල පමාණකං, අටඟලක්පමණ; ඔතාරෙත්වා, පාත්කොට; නිවාසෙතබ්බං, ඇඳියුතුන්නේය; තතො, එයින්; ඌනං, අඩුව; නවට්ටති, නොවටී; "අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී" යනු වදාළබැවින් ඇටැත්පැමිණීමෙහි ගියැති භික්ෂුවකසින් දනමඬලෙන් යට ඇස්වටෙන් උඩ අටඟලක්පමණ අතර ඇරීමකොට වදාළප්‍රමාණයට අඳනය පාත්කොට එයිනුදු අඩුවැඩි නොකර පෙකනිය දෙදන සංඛ්‍යාත ත්‍රිමණ්ඩලප්‍රතිච්ඡාදනයකොට ඇඳීම වටිනේයයි දතයුතු.

මේ පරිමණ්ඩල නිවෙසනයයි.

---

"පරිමණ්ඩලං පාරුපිතබ්බං උභොකොණෙසමං කත්වා" තවද අප සර්වඥයන්වහන්සේ විසින් භික්ෂූන් සඳහා එකාන්සපාරුපනය—පරිමණ්ඩලං, සකස්කොට; උභොකොණෙ සමංකත්වා, දෙකොන් සමකොට; පාරුපිතබ්බං, පෙරවියයුත්තේය යන මේ සික්ෂාපදයට අටුවාචාරීන් දෙදෙනාම විස්තර මෙමෙස් දක්වනලදි.

උභොකොණෙ සමං කත්වා සාදරං පරිමණ්ඩලං
කත්වා පාරුපිතබ්බෙවං අකරොන්තස්ස දුක්කටං.

උභොකොණෙසමංකත්වා, දෙකොන්සමකොට; සාදරං, සික්ෂාපදයට ආදරඇතුව; පරිමණ්ඩලංකත්වා, සම්පූර්ණකොට; පාරුපිතබ්බං, පෙරවියයුත්තේය; එවං, මෙසේ; අකරොන්තස්ස; නොකරණ භික්ෂූවට; දුක්කටං, දුස්කටාපත්තියවේ.

අවිසෙසෙනවුත්තත්තා ඉදං සික්ඛාපදද්වයං
තස්මා ඝරෙ විහාරෙවා කාතබ්බං පරිමණ්ඩලං.

ඉදං සික්ඛාපදද්වයං, මණ්ඩලාකාරයෙන් ඇඳීම සම්පූර්ණකොට එකාන්සකර පෙරවීම යන මේ සික්ෂාපද දෙක වනාහි අවිසෙසෙන,

ශුනාවෙනාසව මහවත් වෙනසක් නැතුව; වුත්තං, දේසනාකරණලදී; තසමා, එසේහෙයින්; ඝරෙවා විහාරෙවා, ඇතුල්ගමහෝ වෙහෙරහෝ; පරිමංඩලං කාතබ්බං සකස්කර හොඳට ඇඳීම හෝ සම්පූර්ණකොට සිවුරුපෙරවීමහෝ කටයුත්තේය. "උභොකොණෙසමංකත්වානිපාරුපනස්ස එකංසෙන තස්සපිට්ඨි පස්සෙච උදරපස්සෙච ඔලම්බමානෙ උභොකණ්ණෙ හත්ථිපිට්ඨෙ ඝණ්ටා විය සමංකත්වා එකංස පාරුපනංකාතබ්බං උභොකොණෙසමංකත්වා" යනු එකංසෙනතස්ස, එකාන්සකරණලද්දවූ; පාරුපනස්ස, පෙරවීමගේ; පිට්ඨිපස්සෙච, පිටපැත්තේද, උදරපස්සෙච, බඩපැත්තේද; ඔලම්බමානෙ, එල්ලෙනනාවූ; උභොකණ්ණෙ, දෙකොණ; හත්ථිපිට්ඨෙ, ඇතුපිට දමණලද; ඝණ්ටාවිය, ගණ්ටාරමෙන්; සමංකත්වා, සමානකොට; එකංසං, එකාන්සසිවුරුපෙරවීම; කාතබ්බං, කටයුත්තේය.

මේ එකාන්ස පාරුපනයයි.

---

නවද සව්නෙගෙවා දත් අපබුදුරජානන්වහන්සේ විසින් ඉතා සිවුන්වසයෙන් දෙසනාකරණලද ගණ්ඨිපාසයෙන් යුක්තවූ දෙවිර වසා පෙරවීමයයි කියනලද සුපිළිසන්කිරීම කෙසේදයත්?

"සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගන්තබ්බං"

සුපිළිසන්ව ඇතුල්ගම සඞ්ඛ්‍යාත ග්‍රාමයෙහි යායුත්තේය—තත්ථ සුට්ඨුපටිච්ඡන්නො සුපටිච්ඡන්නො සම්මාපටිච්ඡන්නො යෙන සො සුපටිච්ඡන්නො භික්ඛු—මනාකොට කයවසා ඇතුල්ගමේ යායුතුයි, වදළ මේ සික්ඛාපදයට විස්තරදෙසනාව අටුවාචාරින්වහන්සේ විසින් මෙසේ දක්වනලදී.

ගණ්ඨිකං පටිමුංචිත්වා කත්වා කොණෙ උභොසමං
ඡාදෙත්වා මණිබන්ධංච ගන්තබ්බංතීච මෙවච.

උභොකොණෙසමංකත්වා, දෙකොන්සමකොට; ගණ්ඨිකංපටිමුංචිත්වා, ගණ්ඨිය පාසෙ අමුණා මණිබන්ධංච, මිණිබඳහණද; ගීවමෙවච, ග්‍රීවයද; ඡාදෙත්වා, වසා; ගන්තබ්බං, ගමේයායුත්තේය—සිවුරෙ කොන්දෙක එකතුකර ගණ්ඨිපාසා අමුණා මණිකට්ටුවද බෙල්ලද වසා දෙවිර වැසීමකොට ගැටවටුගන්වා ඇතුල්ගමේදී හෝ පන්සලේ මහජනයා මධ්‍යයෙහි හෝ කටයුතු දතයුත්තේය.

තථා අකත්වා භික්ඛුස්ස ජන්නුනිපි උරම්පිච
විවරිත්වා යථාකාමං ගච්ඡතොහොති දුක්කටං

තථා, එපරිද්දෙන්; අකත්වා, සුපිළිසන්නොකොට; ජන්නුනිපි,

ඉක්කාළුපදින තැණ ජනුවද; උරම්පිම, පපුවද; විවරිත්වා, ඇරීම
ඤකාට; යථාකාමං, කැමතිපරිද්දෙන්; ගච්ඡතො, යන්නාවූ; භික්ඛුස්ස,
භික්ෂුවට; දුක්කටංහොති, දුකුළාපත්තිවේ.

“න හත්ථිසොණ්ඩාකාරෙන සංහරිත්වා පාරුපිතබ්බං”—හත්ථිසො
ණ්ඩාකාරෙන, ඇත්සොඩමෙන්; සංහරිත්වා, අකුලා; නපාරුපිතබ්බං,
නොපෙරවියයුතුකොතය; යන මේ පාඨය සමන්තපාසාදිකා විනෙ අටු
වාවේ දක්වනලදි—“සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ නිසීදිතබ්බං”
සුපිළිසන්ව ඇතුල්ගම ඉඳියුතුයි; යන මේ සික්ෂාපදයට විස්තර අටු
ඨාවේ මෙසේ දක්වනලදි.

ගලවාට කතොඋද්ධං සීසංච මණිබන්ධතො
හත්ථේපිණ්ඩිකමංසමහා හෙට්ඨාපාදෙ උභොපිච.

ගලවාටකතො, බොටුවේ වළපටන්; උද්ධං, උඩ; සීසංච, හිසද;
මණිබන්ධතො, මිණිබහන පටන්; හත්ථේ, අත්දෙකද; පිණ්ඩිකමං
සමහා, පිඩුමසපටන්; හෙට්ඨා, යට; අපිච, වැළිඳු; උභොපාදෙ, පාදෙ
කද; විවරිත්වා; මෙකී පංචස්ථානය විවෘතීනව සිවුරෙන් නොවසා;
අවසෙසංච, ඉතිරි සෙසුශරීරය; ඡෙ, ඉදින්; ඡාදෙත්වා, සිවුරුවලින්
වසා; නිසීදති, ඉඳිනේද; සො, ඒභික්ෂුතෙමේ; සුපටිච්ඡන්නොහො
ති, සුපිළිසන්ව ඉඳීමවන්නේය; වාසයට ඉලඹියාවූ භික්ෂුවට සුපිළි
සන් රහිතවූයේද දෙසනැත්තේයයි දතයුතු–“ගලෙආවාටො ගලාවා
ටො තස්මා ගලාවාටකතො ගලාවාටො යස්ස සො ගලාවාටකොභික්ඛු–
උද්ධංච තං සිසංචාති උද්ධසීසං තං උද්ධසීසං—මණීච බන්ධංච මණිබන්ධං
තස්මා මණිබන්ධතො—හත්ථමෙව හත්ථො තෙ හත්ථේ—එත්ථ හත්ථේති
කම්මබහුවචනං—පිංඩංච තං මංසංචාති පිංඩමංසං තස්මා පිංඩිකමං
සම්හා මංසපිංඩං යස්ස සො මංසපිංඩිකො—හෙට්ඨමෙව හෙට්ඨං පාද
මෙව පාදං උභොච තෙ පාදනිචාති උභොපාදනි තෙ හෙට්ඨා උභො
පාදෙ අපි චෙත්ථ පදපූරණං—සො තෙනසද්ධං සුත්වා චක්ඛුනාරූපං
දිස්වා” යනාදි තැණෙහි කර්ණයුග්මයම ශබ්දශ්‍රවණයට යෙදෙත්, රූප
දර්ශනයටද එසේම නෙත්‍රවය යෙදෙති එපරිද්දෙන් මණිබන්ධතො පිං
ඩිකමංසමහා යන තැණෙහිද අත්දෙකේම මිණිබහන්දෙක සහ පාදෙ
කේම පිඩුමස්දෙකම ගැණෙන් දතයුතු–“න බාහුප්පචාලකං අන්තරඝ
රෙ ගමිස්සාමිහි සික්ඛාකරණීයා”–යන තැණෙහිද සුපිළිසන්ව ඇතුල්
ගම යාමේදී පවා අත්දම්මා යාමටද තහනම්බව දතමැනවි—“ගාමෙවා
හොතු විහාරෙවා මනුස්සානං පරිවෙසනට්ඨානං ගච්ඡන්තෙන න චීව
රං පාරුපිත්වා කායබන්ධනං බන්ධමෙව වට්ටතීති අට්ඨකථායං වුත්තං”
යන මේ නියමය ගිලනට බව දතයුතුකොතය–“එත්ථ පන යො භික්ඛු
සඤ්ඤුදස්සනට්ඨානෙ උභො අංසෙ පාරුපති අයං සත්ථරි අගාරවො

නාම සංඝමජ්ඣෙ උභො අංසෙ පාරුපති අයං සංඝෙ අගාරවො නාම"
මෙනි අදහසනම් බුද්ධරජානන්වහන්සේද මහාසංඝයාමෙද දෙවීරවසා
සූප්‍රිසන්ඩ්ඛිරීම නැගිකල්හි ශාස්ත්‍රෑන්වහන්සේ ඉදිරියෙහිද මහසං
ඝයා ඉදිරියෙහිද දෙවීරවසා පෙරවීම සමෙක් නරක්නේවීනම් අගරු
බව වදාළසේක — මේ සාසනසුද්ධිදීපනියෙහි හයවෙනි සුපටිච්ඡන්නා
පරිච්ඡේදය කියා නිමවනලද්දේය.

සුපටිච්ඡන්න පරිච්ඡේදයයි.

---

තවද මේ සද්ධර්මප්‍රකරණයෙහි කප්පාකප්ප පාත්‍රප්‍රභේදය කෙසේද යත්? "තඤ්ච අයොපත්තො මත්තිකපත්තො ඉමෙ වෙ පත්තා කප්පියා තම්බලොහාදිපත්තා අකප්පියා" කඤ්ච, එහි; අයොපත්තො, යකඩ පාත්‍රය; මත්තිකපත්තො, මැටිපාත්‍රය යන; ඉමෙ වෙ පත්තා, මේ පාත්‍ර දෙක; කප්පියා, කැපවෙති; තතො, එයින්; අඤ්ඤෙ, අන්‍යභාජන; අකප්පියා, ඇකපවෙත්; "එව් උක්කට්ඨො මජ්ඣිමො මුදුකොති තිහි භොන්ති"—එව්, මෙනි; උක්කට්ඨො, උත්කෘෂ්ටපාත්‍රය; මජ්ඣිමො, මධ්‍යමපාත්‍රය; මුදුකො, මෘදුකපාත්‍රයයි කියා; තිහිහොනති, තුන්වැදරුම්වෙති; "තෙසු උක්කට්ඨො පත්තො වෙ තණ්ඩුලනාළිනතානංච සඤුපබ්‍යංජනානංච ගණ්හාති"—තෙසු, එපාත්‍රතුණ අතරෙන්; උක්කට්ඨො පත්තො, පලමුවෙනිපාත්‍රය; මගධනාළියා, අට්පතගත්නා මගධනැළියෙන්; වෙතණ්ඩුලනාළි, හාල්නැළිදෙකේ; හත්තංච, බතද; සඤුපබ්‍යංජනංච, කැව්ළිසහිත මාළුද; ගණ්හාති, ගනී—"මජ්ඣිමො තස්ස උපඩ්ඪො දට්ඨබ්බො" මජ්ඣිමො, මධ්‍යමපාත්‍රය: තස්ස, එයට; උපඩ්ඪො, අඩ්ඩියබව; දට්ඨබ්බො, දතයුතුයි; "ඔමකො තතො උපඩ්ඪො" ඔමකො, මෘදුකපාත්‍රය; තතො, එයින්; උපඩ්ඪො, අඩ්ඩියබව දතයුතු; "තම්බලොහාදිපත්තා අකප්පියා" තතො, එයින්; අඤ්ඤදපත්තා, අන්‍යභාජන; අකප්පියා, දන්වැළඳීමට ඇකපවෙත්.

පත්තෙන නීහරන්තස්ස උච්ඡිට්ඨමුදකම්පිච
අකප්පියංච පත්තංවා පරිභුංජෙය්‍ය දුක්කටං

උච්ඡිට්ඨං උදකම්පිච, ඉඳුල්දියද; පත්තෙන, පාත්‍රයෙන්; නීහරන්තස්ස, ගෙණයන්නාහට; දුක්කටං, දුස්කටාපත්තිවේ; අකප්පියංච පත්තංවා, ඇකපපාත්‍රයක්; පරිභුංජෙය්‍ය, පරිභොගකරන්නේනම්; දුක්කටං, දුස්කටයක්වේ; "එතං ඉමං පත්තං අධිට්ඨාමි ඉති" කියාද, "එතං පත්තං අධිට්ඨාමි" කියාද. "ඉමං පත්තංඅධිට්ඨාමි" කියාද, එතං ඉමංපත්තං පච්චුද්ධරාමි ඉති" කියාද, එතං පත්තං පච්චුද්ධ

රාමි" කියාද—"ඉමං පත්තං පච්චුද්ධරාමි" කියාද—එවං; මෙසේ; චීවරාදිං, සිවුරු ආදිය; යථාවිධි, විධානවූ පරිද්දෙන්; පච්චුද්ධරෙ; පච්චුද්ධරණයකරන්නේය; අධිට්ඨෙ, අධිෂ්ඨාන්කරන්නේය:

මිඩ්ඪෙනෙ පරිභණ්ඩන්තෙ පාදෙ ඡත්තෙ ඨපෙය්‍යවා
චලකාදිං ඨපෙපත්තෙ පත්තෙවා හත්ථමොචනෙ.

මිඩ්ඪෙනෙ, ගේ කෙළවර හෝ; පරිභණ්ඩෙනෙතවා, පිල්කෝලවරහෝ; පාදෙවා, පිටිපයේ හෝ; ඡත්තෙවා, ඡත්‍රයෙහි හෝ; ඨපෙය්‍යවා, තබානම් දුස්කටයක් වේ; පත්තෙ, පාත්‍රයෙහි; චලකාදිං, මත්ස්‍ය මාංස ඇටකටු ආදිය; ඨපෙ, තබානම් දුකුලා වෙයි; පත්තෙ, පාත්‍රයෙහි; හත්ථමොචනෙනවා, අතසේදීම කරන්නේ හෝ දුකුලා වේ.

විකප්පනමධිට්ඨාන මකත්වානපමාණිකං
දසාහමතිමාපෙති පත්තං නිස්සග්ගියං සියා.

විකප්පනං-ඉමං පත්තං තුය්හං විකප්පෙමි-අධිට්ඨානං-ඉමං පත්තං අධිට්ඨාමි—අකත්වාන, නොකොට; පමාණිකං, ප්‍රමාණයෙන්; පත්තං, පාත්‍රය; දසාහං, දසදිනක්, අතිමාපෙති, පසුකළානම්: නිස්සග්ගියං, නිසගිඇවත; සියා, උපසම්පන්න භික්ෂුවට වන්නීය.

පංචබන්ධනතොඌන පත්තෙ සතිපරංපන
විඤ්ඤාපෙති නවංපත්තං තස්සනිස්සග්ගියං සියා.

පංචබන්ධනතො, බැඳුම්පහකින් ඇහෝ නොහොත් පිසීම ආදී පිළියම් පහකින්; ඌනපත්තෙ, අඩුපාත්‍රයක්; සති, තමාට ඇතිකල්හි එපාත්‍රා පිළියම්කරනොගෙණ; පරං නවංපත්තං, අනික් අළුත්පාත්‍ර යක්; විඤ්ඤාපෙති, නොනෑ කැපකරු නොවන යමෙකුගෙන් ඉල්වා ගණීනම්; තස්ස, ඕහට; නිස්සග්ගියං, නිසගිඇවත සියා, වන්නීය— "පත්තසඤ්ඤී පිංඩපාතං භුංජිස්සාමීති සික්ඛාකරණීයා" යනුහෙ යින්, පාත්‍රෙ යන සඤ්ඤාව සිතා වෙන භාජනයක දන්වැළඳීම අපද වක් ඇතිකල්හි විනා නිතර දෙසවන්නේමැයි එ අනුදැනීම හැමවි ටම නොගතයුතු බව ධම්මධර විනෙධර භික්ෂූහු විජානනය කරති- අලජ්ජිදුස්සීල ශ්‍රමණයො විජානනය නොකරෙත්යයි දතයුතු.

මේ සාසනසුද්ධදීපනියෙහි හත්වෙනි පාත්‍රා පරිභොග විශෙසන පරිච්ඡෙදය නිමි.

පාත්‍රානිදර්ශන පරිච්ඡෙදයයි.

---

තවද මේ සාසනසුද්ධදීපනියෙහි කුඩිඉසල්මේ ප්‍රභෙදය කෙසේද යත්? "තෙනඛොපන සමයෙන, එසමයෙහිවනාහි; සඞ්ඝස්ස, සඞ්ඝයා ට; ඡත්තංඋප්පන්නංහොති, කුඩ ලැබෙනලද්දේය; භගවතො, භාග ක්ෂට; එතමත්ථං, එබව; ආරොචෙසුං, කීහු; "අනුජානාමි භික්ඛවෙ

ඡත්තං." ගිලානෙනි තොපට කුඩඉසලීම අනුදනිමි වදාළසේක—තේ
නබොපන සමයෙන, එසමයෙහි වනාහි; ඡබ්බග්ගියා භික්ඛූ, සවි
වගීනභික්ෂූහු; ඡත්තපග්ගහිතා, කුඩඉසලා; ආහිණ්ඩන්ති, ඇවිදිත්;
තෙනඛොපන සමයෙන; එසමයෙහිවනාහි; අඤ්ඤතරො උපාසකො,
එක්තරා උපාසකයෙක්; සම්බහුලෙහි ආජීවක සාවකෙහිසද්ධිං, බො
හෝ ආජීවක ශ්‍රාවකයන්හා සමග; උය්‍යානං අගමාසි, උයනටගියේය;
තෙ ආජීවක සාවකා, ඒ ආජීවක ශ්‍රාවකයෝ වනාහි; දුරතොව, දුරි
න්ම; ඡත්තපග්ගහිතෙ, කුඩඉසලාගෙණ; ආගච්ඡන්තෙ, එනනාවූ;
ඡබ්බග්ගියෙ භික්ඛූ, සවිවගීගභික්ෂූන්; අද්දසාසුං, දුටුවාහුය; දිස්වාන,
දැක; තං උපාසකං, ඒ උපාසකයාට; එතදවොචුං, එකාරණයකීවා
හුය; ගණකමහාමත්තා, අමාත්‍යසමූහයක්; සෙය්‍යථාපි, යම්සේ කුඩ
ඉසලාඑද්ද එමෙන්; තුම්හාකං, තොපගේ; භදන්තාඅය්‍යා, පින්වත්
ආය්‍යයෝ; ඡත්තපග්ගහිතා ආගච්ඡන්ති, කුඩඉසලාගෙණ එනනාහු
යයි කීවාහුය; නායතා, ආය්‍යයන් වහන්සේලා නොවෙත්; එතෙ බො
පරිබ්බාජකාති, ඔහු පරිබ්‍රාජිකයොයයි කීයේය; න පරිබ්බාජකාති,
පරිබ්‍රාජිකයො නොවෙත්ලයි කීහු; අථඛො, ඉක්බිතෙනන් වනාහි;
සො උපාසකො, එඋපාසකයා; උපගන්ත, භික්ෂූන් එළඹිකල්හි; සංජා
නිත්වා, ඇඳින; උජ්ඣායති, ලාමකකොට සිතුයේය; ඛියති, නිඥ
කොට, කථාකෙළේය; විපාචෙති, විසෙසයෙන් ප්‍රකාසකොළේය;
කථංහි—පෙ—භගවතො, භගවන්හට; එතමත්ථං, මේකාරණය;
ආරොචෙසුං, දැන්වූහ; සච්චංකි—පෙ—යො ඡත්තංධාරෙය්‍ය ආපත්ති
දුක්කටස්සාති, යමෙක් කුඩයක් දරා නම් දුස්කටාපත්තියයි වදාළසේක්;
"අනුජානාමි භික්ඛවෙ ගිලානස්සඡත්තං අනුජානාමි භික්ඛවෙ අගි
ලානෙනාපි ආරාමෙ ආරාමූපචාරෙ ඡත්තං ධාරෙතුං"

අගිලානො සචෙභික්ඛු ඡත්තං ධාරෙය්‍ය දුක්කටං
අත්තනො චීවරාදීනං ගුත්තත්ථං පන වට්ටති

සචෙ, ඉදින්; අගිලානොභික්ඛූ, නොගිලං භික්ෂූතෙමේ; ඡත්තංධා
රෙය්‍ය, කුඩය දරා නම්; දුක්කටං, දුකුලාවේ; අත්තනො, තමන්ගේ;
චීවරාදීනං, සිවුරුආදීන්ගේ; ගුත්තත්ථංපන, රැකගැණීමපිණිස වන්නා
හි; වට්ටති, වටී; ගිලානස්සඡත්තන්ති, ගිලානස්සඡත්තං යනු; යස්ස,
යම් භික්ෂූවකට; කායඩාහොවා; ඇඟ දැවිල්ලක් හෝ; පිත්තකො
පොවා, පිතකිපීමක් හෝ; හොති, වේද; චක්ඛුදුබ්බලංවා, ඇස්නොප
නිම හෝ; අඤ්ඤොවා, අනික්; කොචිආබාධො, කිසිආබාධයක්;
විනාඡත්තා, ඡත්‍රඇර; උප්පජ්ජති, උපදීද; තස්ස, එභික්ෂූවට; ගාමෙ
වා, ගමදී හෝ; අරඤ්ඤෙවා, වනයේදී හෝ; ඡත්තං, කුඩය; ධාරෙතුං,
දරන්ම; වට්ටති, වටනේය; වසෙසපන, වැස්ස ඇතිකල්හි වනාහි;

චීවරගුත්තත්ථාය, සිවුරු රැකගැනීම පිණිස හෝ වාළමෘග ප්‍රහාරයකට ඇනිකල්හි යෝ; අත්තගුත්තත්ථම්පි, ශරීරය රැකගැනීම පිණිසද; වම්මන්ති, චර්මයයි එළුලොමයෙක;--නිසජ්ජාව කුඩඉහළණ අව කාසඇතිබව එම දෙසනාවෙන් දතයුතු--ඡත්තං, ඡත්‍රය; ඡත්තානි, ඡත්‍ර තියයක්ද: සෙතඡත්තං, සුදුකුඩය; කිලඤ්ජඡත්තං, බටඡත්‍රය: පණ්ණඡත්තං, පණ්ණඡත්‍රය; එකපණ්ණඡත්තං, එකපණ්ණඡත්‍රයයි; චතුක්කොණො, කොන හතරාකාරයයි; සෙතඡත්තං යනු වස්පලිගුණ්ඨිතං, මරදිගතා සාදනලද; පණ්ණරඡ්ජතං, සුදුකුඩයයි; කිලඤ්ජඡත්තං යනු විලිවඡත්තං, බට ලනහුම්වලින් සාදනලද විලිවඡත්‍රයයි; පණ්ණඡත්තං යනු කොළවලින් සාදනලද පණ්ණඡත්‍රයයි; "තාලපණ්ණාදීහි යෙනකෙනචි කතං පණ්ණඡත්තනති වුච්චති" එකපණ්ණඡත්තං යනු ජාතදණ්ඩකෙන කතං එකපණ්ණඡත්තං, ජාතදණ්ඩකයෙන් කරණලද්දාවූ එකපණ්ණඡත්‍රයයි; අන්‍ය වැල් ශ්‍රී ජාතියක් නොගෙණ එවිලපත් ලියෙන් කරණලද්දේයයි දතමැනවි මෙසේ සතරවැදෑරුම් කුඩඉසලීම ඇර නලතශාඛ බෝගා ඉසලීම සම්ඥපුත්‍රයන්ට නියම නැත්තේය--"පදං පදං දුක්කටං භවති"--මේ සාසනසුද්ධිදීපනියෙහි අටවෙනි ඡත්‍රපරිච්ඡේදය නිමි.

ඡත්‍ර පරිච්ඡේදයයි.

---

තවද මේ සද්ධම්මොදයයෙහි අඞ්ගසමාදාන පරිච්ඡේදය කෙසේද යත්? "පංසුකූලිකංගං තෙචීවරිකංගං පිණ්ඩපාතිකංගං සපදානචාරිකංගං එකාසනිකංගං පත්තපිණ්ඩිකංගං ඛලුපච්ඡාභත්තිකංගං ආරඤ්ඤිකංගං රුක්ඛමූලිකංගං අබ්භොකාසිකංගං සොසානිකංගං යථාසන්ථතිකංගං නෙසජ්ජිකංගං"--මෙකී තෙලෙස්ධුතාඞ්ග සමාදානය අඞ්ගධාරිකයෙක් ගම්පයෙහි හෝ ධාතුකරඬු දාගැබ් ජයමහාබෝධි මෙකී චෛත්‍යයන්කරා එළඹ වත්සපයා උක්කුටුකයෙන් ඉඳ බුද්ධරජානන්වහන්සේගෙන් අඞ්ගසමාදම්වෙමි සිතා වාක්‍යකියා සමාදම් වියයුතුනාතය--එ අඞ්ග දහතුණේ වාක්‍ය දහතුණ මෙසේ දතයුතු--ගහපතිදාන චීවරං පටික්ඛිපාමි පංසුකූලිකඞ්ගං සමාදියාමි--ගෘහපතියෙක් විසින් දෙණලද සිවුරු ප්‍රතික්ෂෙපකරමි පංසුකූලික අඞ්ගය සමාදම්වෙමි--ගහපතිනොදානං ගහපතිදානං. ගහපතිදාන චීවරං අහං පටික්ඛිපාමි පංසුකූලිකඞ්ගං සමාදියාමි--පංසුකූලිකස්ස අඞ්ගං පංසුකූලිකඞ්ගං චතුත්ථකචීවරං පටික්ඛිපාමි--තෙචීවරිකඞ්ගං සමාදියාමි--සිවුරු සතරක් පිළිගැණීම ප්‍රතික්ෂෙපකරමි--තුන්සිවුර පරිහරණය කරණ තිචීවරික අඞ්ගය සමාදම්වෙමි--චතුණ්ණං පූරණො චතුත්ථො චතුර්ථි චීවරෙහි තිපූරෙනා චතුත්ථො අහං චතුත්ථං චීවරං පටික්ඛි

ප්‍රාමි තෙචීවරිකඞ්ගං සමාදියාමි තිචීවරෙණ යුත්තො තෙචීවරිකො තිචීවරිකස්ස අඞ්ගං තෙචීවරිකඞ්ගං අහං තිචීවරිකඞ්ගං සමාදියාමි– අතිරෙකලාභං පටික්ඛිපාමි පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමි—අඞ්ගභෙදය වන අතිකාහර ලැබීම ප්‍රතික්ෂෙපකරමි පිණ්ඩපාතික අඞ්ගය සමාදම් වෙමි—අතිරෙකොච සො ලාභොචාති අතිරෙක ලාභො අතිරෙක ලාභෙන යුත්තො අතිරෙකො අහං අතිරෙකලාභං පටික්ඛිපාමි පිණ්ඩ පාතිකඞ්ගං සමාදියාමි—පිණ්ඩපාතිකස්ස අඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං පිණ්ඩානංපාතො පිණ්ඩපාතො—පිණ්ඩපාත අඞ්ගය සමාදම්වූ භික්ෂු තෙම සංඝයාගෙන් නිරාමිස සලාකද වෙහෙර පිසූ බතද පිළිගංඩ වටී ඉදිරියෙන්ද පස්සෙන්ද ගෙණෙනලද බතද පිළිගංඩවටී; පැමිණි දෙ රදී පාත්‍රෙදීම වටී; පසු ගෙණදෙනලද බතද පිළිගණී—එදවස ඉද බත ගංඩවටී; ආරාධනාවෙන් කිසි බතක් පිළිගංඩ නොවටීමැයි—වෙහෙ රදී තමන්ට දන්දීමපිණිස පාත්‍රෙ ඉල්ලූවිට දෙන්ඩ වටී—වෙහෙරට දන්ගෙණකල්හි හෝ වෙරෙන් පිට හෝ දන් තබාගණ සිටිණ තැ ණට පිණ්ඩපාතයාම නොවටින්නේයයි දතයුතු.

ලොළුප්පවාරං පටික්ඛිපාමි සපදානචාරිකඞ්ගං සමාදියාමි–ආහාරලො භය ප්‍රතික්ෂෙපකරමි සපදානචාරික අඞ්ගය සමාදම් වෙමි—"ලො ලුස්සභාවො ලොළුප්පං–ආහාර ලොළුප්පෙන චරතීති ලොළුප්පචා රො–අහං තං ආහාර ලොළුප්පචාරං පටික්ඛිපාමි සපදානෙ චරතීති සපදානචාරී සපදානෙ චරණං එතස්ස අත්ථීති සපදානචාරිකො සපදාන චාරිකස්ස අඞ්ගං සපදානචාරිකංගං "නානා ආසන භොජනං පටික්ඛි පාමි එකාසනිකංගං සමාදියාමි" නොයෙක් ආසනවල ඉඳ ආහාර අනුභවකිරීම ප්‍රතික්ෂෙපකරමි එකාසනික අඞ්ගය සමාදම්වෙමි– "නානාආසනෙසු නිසීදිත්වා භොජනං නානාආසන භොජනං නානා ආසන භොජනං එතස්ස අත්ථීති නානා ආසනිකො නානා ආසනෙසු භොජනත්ථාය නියුත්තො නානා ආසනිකො නානා ආසනභොජනං පටික්ඛිපාමි එකමෙව ආසනං එකාසනං භොජනත්ථාය එකාසනෙන නියුත්තො එකාසනිකො එකාසනෙ භොජනං එතස්ස අත්ථීති එකා සනිකො තස්ස අංගං එකාසනිකංගං අහං එකාසනිකංගං සමාදියාමි" එකී උත්කෘෂ්ට තෙම අනුභවයට පටන්ගත්කල්හි අවසානවනතුරු කිසිවක් නොගන්නේය; බෙහෙත් පිණිස ගතයුත්තේය— මධ්‍යම තෙමේ යම්තාක් භාජනයෙහි බත් ක්ෂයනොවේද එතාක් කැමති සෑමති සමක් බෙදවාගතයුත්තේය—මේ තෙමේ වනාහි භොජනපරියන්තික නම්වේ—මෘදුකතෙමේ යම්තාක් ආසනෙන් නොනැගීද්ද එතාක් බෙදවා අනුභවකිරීම ලබයි; මේතෙම උදක පරියන්තික නම්—එකාසනිකතෙමේ ආසනෙන ඉඳ අනුභවයට පටන් නොගත්තාතෙක් කවුආදිය ඉවත්කොට අනුභව වකයුතුයි මේ උත්

කාෂ්ටවසයෙනි, මධ්‍යම මෘදුක දෙඅදන අනුභවකරමින් කවුආදිය ඉවත දමදමා අනුභවකටයුත්තාහ "දුතියකභාජනං පටික්ඛිපාමි පත්තපිංඩිකංගං සමාදියාමි" අහරකිසට භාජන දෙකක් ගැණීම ප්‍රතික්ෂෙපකරමි පත්තපිංඩික අංගය සමාදම්වෙම්—දිනානං පූරණො දුතියො භාජෙන්ති භාජනං අහං දුතියකභාජනං පටික්ඛිපාමි පත්ත පිංඩිකස්ස අඞ්ගං පත්තපිංඩිකංගං අහං පත්තපිංඩිකංගං සමාදියාම" පත්තපිංඩික අංගයෙහි පිහිටි උත්කෘෂ්ටයා විසින් අනුභව කාලයෙහි කවුආදිය ඉවත්කර අනුභවයට උන්කල්හි අවසානවන තුරු නොනැගිට එක්භෙතක භාජන සියයක් ඉවත්කරමින් අනුභව කළත් අංගය නොබිඳේ—බත්පිඩු කැබිලි ආදිය කඩකඩා කෑම නොවටී; මධ්‍යමයාවිසින් එක අතින් කඩාකෑම වටී; මෘදුකයාවිසින් සියලු අතින්හෝ දතින්හෝ බිඳකෑම වටනේමැයි.

"අතිරිත්තභොජනං පටික්ඛිපාමි ඛළුපච්ඡාභත්තිකංගං සමාදියාමි" පවාරණයවීමෙන් ඉතිරිවූ බත බළුනම් පක්ෂියාමෙන් අත්අරිමි බළු පච්ඡාභත්තික අංගය සමාදම් වෙමි—"නාතිරිත්තං අතිරිත්තං අතිරිත්තං ච තං භොජනංචාති අතිරිත්තභොජනං අහං තං අතිරිත්ත භොජනං පටික්ඛිපාමි පවාරිතෙන පච්ඡාලද්ධං භත්තං පච්ඡාභත්තං පච්ඡාභත්ත භොජන සීලමස්ස ඉති පච්ඡාභත්තිකො නපච්ඡාභත්තිකො ඛළු පච්ඡාභත්තිකො සමාදානවසෙන පටික්ඛිත්තාතිරිත්තභොජනස්සෙතං නාමං—තස්ස අංගං ඛළුපච්ඡාභත්තිකංගං අහං තං ඛළු පච්ඡාභත්තිකංගං සමාදියාමි-තෙන පන ඛළුපච්ඡාභත්තිකෙන පවාරෙත්වා පුන භොජනං කප්පියං කාරෙත්වා නභුංජිතබ්බං-ගාමන්ත සෙනාසනං පටික්ඛිපාමි ආරඤ්ඤිකංගං සමාදියාමි-ගම සෙනස්න ප්‍රතික්ෂෙපකරමි ආරඤ්ඤික අංගය සමාදම්වෙමි—ගාමං තං ච තං සෙනාසනංචාති ගාමන්තසෙනාසනං අහං තං ගාමන්ත සෙනාසනං පටික්ඛිපාමි—අරඤ්ඤෙ නිවාසො අස්සාති ආරඤ්ඤිකො තස්ස අංගං ආරඤ්ඤිකංගං අහං තං ආරඤ්ඤිකංගං සමාදියාමි—ඡන්නං පටික්ඛිපාමි රුක්ඛමූලිකංගං සමාදියාමි—සෙවිලි ඇති සෙන සුණ්හි විසීම අරිමි රුක්ඛමූලික අංගය සමාදම්වෙමි—ඡාදෙතීති ඡන්නං අහංඡන්නං පටික්ඛිපාමි—රුක්ඛමූලෙ නිවාසො අස්සාති රුක්ඛමූලිකො තස්ස අංගං රුක්ඛමූලිකංගං අහං තං රුක්ඛමූලිකංගං සමාදියාමි ඡන්නංච රුක්ඛමූලංච පටික්ඛිපාමි-අබ්භොකාසිකංගං සමාදියාමි—ප්‍රතිච්ඡන්නයද රුක්මුලද ප්‍රතික්ෂෙපකරමි අබ්භොකාසික අංගය සමාදම්වෙමි—රුක්ඛස්සමූලං රුක්ඛමූලං-අහං ඡන්නංච රුක්ඛමූලංච පටික්ඛිපාමි-අබ්භංච ඔකාසොච අබ්භොකාසො-අහං තං අබ්භොකාසිකංගං සමාදියාමි—න සුසානං පටික්ඛිපාමි සොසානිකංගං සමාදියාමි—සොහොන ප්‍රතික්ෂෙප නොක

රමි සොසානිකාංගය සමාදම්වෙමි—සුසානෙ නිවාසො අස්සාති සොසා සානිකො තස්ස අංගං සොසානිකාංගං අහං තං සොසානිකාංගං සමාදියාමි—සෙනාසන ලොළුප්පං පටික්ඛිපාමි යථා සන්ථතිකාංගං සමාදියාමි-සෙනසුන්හි ලොල්බව ප්‍රතික්ෂෙපකරමි යථා සන්ථතික අංගය සමාදම්වෙමි—සෙනාසනෙ ලොළුප්පං සෙනාසනලොළුප්පං-ලොලස්සභාවො ලොළුප්පං ඛිපතීති ඛෙපො සෙනාසන ලොළුප්පං අහං පටික්ඛිපාමි යදෙවසන්ථතං යථාසන්ථතං ඉදං තුය්හං පාපුණාතීති අවෙරා—එවං පඨමං උද්දිට්ඨ සෙනාසනසෙසතං අධිවචනං-තස්මිං යථා සන්ථතෙ විහරිතුං සීලමස්සාති යථා සන්ථතිකො-තස්ස අංගං යථාසන්ථතිකාංගං අහං තං යථා සන්ථතිකාංගං සමාදියාමි—සෙය්‍යං පටික්ඛිපාමි නෙසජ්ජිකාංගං සමාදියාමි—නිදාගැනීම ප්‍රතික්ෂෙපකරමි නෙසජ්ජික අංගය සමාදම්වෙමි—සෙය්‍යංසයනභාවො සෙය්‍යං නිසජ්ජසභාවො නෙසජ්ජං-නිසජ්ජෙන වාසො අස්සාති නෙසජ්ජිකො තස්ස අංගං නෙසජ්ජිකාංගං අහං තං නෙසජ්ජිකාංගං සමාදියාමි—යනාදීන් දක්වනලද මේ තෙළෙස්ධුතාඞ්ග සමාදන්ව රක්‍ෂාකරනලද්දවූ උපාසක උපාසිකාදීන්ට නිර්වාණප්‍රතිලාභය නැත්තේයයි දතයුතු—මේ සාසනසුද්ධිදීපනියෙහි නවවෙනි අඞ්ගපරිච්ඡෙදය කියා නිමවන ලදි.

---


### නවද මේ ප්‍රකරණයෙහි දළ්හීකම්ම පරිච්ඡෙදය කෙසේදයත්?

සනරාමර ලොකයාගේ අභිවෘද්ධියට හෙතුවූ දළ්හීකර්මය අනුකූලලෙස දක්වම්හ—“දළ්හං කරොන්ති දළ්හීකම්මං දළ්හංව තං කම්මංචාති දළ්හිකම්මං—එතරහි අභ්‍යාසෙන පුනප්පුනං කරොතීති දළ්හීකම්මං නාම—යථාහි ආවුසොතිවා භන්තෙතිවා යක්ඛොතිවා සප්පොතිවා වුත්තෙන දළ්හීකම්මං නාම න හොති ආවුසො ආවුසො භන්තෙ භන්තෙ යක්ඛො යක්ඛො සප්පො සප්පොතිවුත්තෙ පන දළ්හීකම්මං නාම හොති—නවද දළ්හීකර්මය දැනගැනීමට මේ පාඨ ඈවි විවසියයුතු—ව්‍යඤ්ජනවශයෙන්ද උපසර්ගවශයෙන්ද අභිවෘද්ධියෙන්ද නැවත නැවත කීම දළ්හීකර්මය නම්වේ—ඊට උදාහරණ මෙසේ දතයුතු—ඈවැත්ති කියා හෝ ස්වාමිණී කියා හෝ යක්‍ෂයෙක සර්පයෙක කියා හෝ කීමෙන් දළ්හීකර්මය නොවේ-ඈවැත්ති ඈවැත්ති ස්වාමිණි ස්වාමිණී යක්‍ෂයෙක යක්‍ෂයෙක සර්පයෙක සර්පයෙක කීකල්හි වනාහි දළ්හීකර්මයවේ-දළ්හීකර්මය කියන්නේ වැරදුනුපද නැවත නැවත කියා සම්පූර්ණකිරීම වනෙනය-එකම දෙවිටක් කීකල්හි දළ්හීකර්මයවන්නේමැයි-ඈවැත්ති ඈවැත්ති ස්වාමිනි ස්වාමිනි යක්‍ෂයෙක යක්‍ෂයෙක සර්පයෙක සර්පයෙක කියාදෙහෝ නොහොත් බුද්ධංසරණංගච්ඡාමි යනාදී පංචසීලය උපොසථසීලය දස

සීලය සරණාගමණෙන් පටන් එළු සිල් සමාදම්වනකල්හි වරදින ලද පදපාළුවක නැවත කියා සිල්සමාදම්වීමද දළ්හීකම්මයයි ගන්නේය-එට නිදර්ශනය මේ දක්වනලද දෙසනාවෙන් හඟිනුමැනවී,—ඤත්ති දුතිය කම්මං ඤත්ති චතුත්ථකම්මවසෙන කරියමානං දළ්හතරං හොතීති එකමෙවිමදනානි එවං පන සතිකම්මං සඞ්කරො හොති තස්මා න යා තබ්බන්ති පටික්ඛිත්තමෙව තංමෙව පන අක්ඛරපරිහීනං වා පදපරිහී නංවා දුරුත්තපදංවා හොති තස්ස සොධනත්ථං පුනප්පුනං වත්තුං වට්ටති ඉදං අකුප්පකම්මෙම දළ්හීකම්මං හොති කුප්පකම්මෙ කම්මං හුත්වා තිට්ඨති—තවද ඤත්ති දුතියකර්මය ඤත්ති චතුර්ථ කර්මවස යෙන්-තථාති-අනුජානාමි භික්ඛවෙ ඤත්ති චතුත්ථකම්මවසෙන උප සම්පදෙතුන්ති-මහණෙනි ඤත්ති චතුර්ථකර්මවසයෙන් උපසම්පදාව අනු දනිමි වදාළබැවින් උපාධ්‍යග්‍රහණය ඤප්තිය පත්‍රාචිවරාදීන්ගේ සම්පූර්ණත්වයද ඇතුවීම ඇති අනුශ්‍රාවණය අස්වනකල්හිද සියලු උපසම්පදා කර්මයෙහි එදවසේ වර්තමාන කාලයෙහිම උපසම්පදාමා ලකයෙහිදී උපසම්පදා ප්‍රතිඥාව හෙයින් අක්ෂරපිරිහීමක්හෝ පදපිරි හීමක්හෝ වරදවා නපුරුකොට කියනලද පදයක් හෝ වේද එ සුද්ධ කොට සම්පූර්ණකිරීමට ඒ භික්ෂුව කෙරෙහි අනුකම්පාවෙන් එඋප සම්පදා කළ දිවසෙම වාක්‍ය පමණක් කියවීම ඉගතුකොටගෙණ නොකිපි කර්මය ඇතිකල්හි දළ්හීකර්මය වන්නේය; කර්මය කොප්‍ය කල්හි දළ්හීකර්මය විමෙන් කර්මය සුද්ධව සීලය පිරිසිදුව සිටිනේ යයි වදාළසේක—එසේහෙයින් යාමණෝරනම උපසම්පදා කළ දව සම කරන්ට නියමකර වදාළ දළ්හීකර්මය එසේ නොකර අන්‍ය නොවමතෙන් විනය අවිනය කරමින් උපසම්පදාවට නිත්‍යවසයෙන් දළ්හීකර්මය වරදවා නොකටයුතුය—"තෙනවුත්තං භගවතා ඉච්චෙතමත්ථං භගවා පුනප්පුනං අකාසි" යනුහෙයින් පුන යන නිපාතය වත්වන්කල්හිද විද්‍යමානබව හඟිනු මැනවි—මේ සාසන සුද්ධිදීපනියෙහි දහමෙහි දළ්හීකර්ම පරිච්ඡේදය කියා නිමවන ලද්දේය.

දළ්හීකර්ම පරිච්ඡේදයයි.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු